## 2023 පෙබරවාරි 14 වන දින මතුගම ප්‍රාදේශීය සභාවේ පැවති මාසික මහ සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව

**පැමිණි ධූරදාරීන්**

| | | |
|---|---|---|
| 1. ලෙව්වන්දුව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා | - | ගරු සභාපති |
| 2. රණසිංහ ආරච්චිගේ දොන් ලලිත් රණසිංහ මහතා | - | ගරු උප සභාපති |
| 3. ලලිත් නිශාන්ත කුලතුංග මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. මද්දුමගේ දොන් අතුල මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 5. කත්‍රිආරච්චිගේ කාන්ත සිරිවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 6. කසුන් හිරෝෂණ මුණසිංහ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 7. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 8. වික්‍රමආරච්චිගේ කමිල් කුමාර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 9. සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. කාලංචිදූරගේ මිත්‍රානන්ද මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11. ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 12. සංජේ එරංග කරවිට මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. ප්‍රේමරත්න නාකන්දල මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. සීතා ඩයස් ජයසිංහ මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. සූරිය ආරච්චිගේ සුජීව නිර්මාණ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. පන්නිල විතානගේ පුෂ්පා නන්දනී මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 17. සම්පතා වඩුගේ තුසිතා ප්‍රියංගනී මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 18. අබ්දුල් මොහොමඩ් රම්සාන් මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. තුඩුගලගේ දොන් රෝහිත මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. මද්දගේ හින්ටන් ගුණසිරි මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 21. මුල්ලේ විතානගේ ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 22. ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 23. කරුණාමුණි ප්‍රසාදික නඳුන් ද සිල්වා මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 24. සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 25. නිමාලක සුරංග විමලසූරිය මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 26. මොතිලාල් සාන්තප්‍රිය රණවීර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 27. සුරේෂ් දර්ශන ජයසේකර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

**නොපැමිණි ධූරදාරීන්**

| | | |
|---|---|---|
| 01. විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 02. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 03. නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. පුබුදු මධුරංග ජයනෙත්ති මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. ධම්මික නිර්මාල් විජේසිංහ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. නිලූකා දර්ශනී සිල්වා මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 07. දෝන ලීලා මුණසිංහ මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

**නිලධාරීන්**

| | | |
|---|---|---|
| 01. කේ.ඩබ්ලිව්.සුනේත්‍රා කාරියවසම් මහත්මිය | - | ලේකම් |
| 02. එම්.කේ.ඩී.සී.අවන්ති මෙනවිය | - | සංවර්ධන නිලධාරී(සභා -කටයුතු) |

මෙදින පෙ.ව.10.00 ට පමණ මතුගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති මෙරිල් මුණසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාසික මහ සභාව රැස්වුහ.පළමු ව ආගම සිහි කිරීමෙන් අනතුරු ව ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයත්,නිලධාරීන් හා මාධ්‍යවේදීනුත් පිළිගැනීමෙන් අනතුරු ව න්‍යාය පත්‍රානුකූල ව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය.

**01. 2023 .01.10 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව සහා අනුමැතිය සලකා බැලීම :-**

ඉහත සභා වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**02. ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතාගේ නිවේදන :- නැත.**

භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/CBP/01/01/05/2022 හා 2023.02.02 දිනැති චක්‍රලේඛය සහ රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL/10/07/05 හා 2023.02.08 දිනැති චක්‍රලේඛය අනුව පළාත් පාලන ආයතන ප්‍රධානීන් විසින් රාජ්‍ය දේපළ අවභාවිත කිරීම යන මැයෙන් සඳහන් වන ලිපිය දැනුම් දෙන ලදී.

**03. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :-**

| | | |
|---|---|---|
| 3.1විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 3.2පුබුදු මධුරංග ජයනෙත්ති මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 3.3ධම්මික නිර්මාල් විජේසිංහ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 3.4නිලූකා දර්ශනී සිල්වා මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

**04. සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම් සහ පැමිණිලි සභාගත කිරීම :-**

4.1 මැලේසියාවෙන් රබර් කිරි ආනයනය කිරීම සම්බන්ධ ව එවන ලද ලිපිය සභාගත කරන ලදී.

4.2 මතුගම පොදු වෙළඳපොළ භූමිය තුළ වෙළඳාම් කටයුතු අඩපන වෙමින් පැවතීම හේතුවෙන් සභාව සමඟ සාකච්ඡාවක් පැවැත්වීම යන කරුණ යටතේ එවන ලද ලිපිය සභාගත කරන ලදී.

4.3 ලංකා සතොස වෙත සුදුසු ගොඩනැඟිලි පහසුකමක් ලබා ගැනීම වෙනුවෙන් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

4.4 ශ්‍රී සාරානන්ද මාවතේ එගොඩ නාරවිල සහ සමඟි මාවතට දිවෙන මාර්ගයේ ඇති පරණ යකඩ පාලම හා සම්බන්ධ ව සී/ස මතුගම,නාරවිල එකමුතු තරුණ සුභ සාධක සමිතිය මඟින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

4.5 මතුගම ඉම්රිච් හෝටලය මඟින් බදු කුලී සහනය ලබා ගැනීම සඳහා එවන ලද ලිපිය සභාගත කරන ලදී.

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න:-**

**5.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාන මහතා විසින් යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න:-**

5.1.1 2021 මාර්තු මස සිට 2022 මාර්තු දක්වා එක් එක් මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා ලබා ගත් දුරකථන ගාස්තු වාර ගණන කීයද?

5.1.2 දුරකථන ගාස්තු ලබා ගත් ගාස්තුව කීයද?
(පිළිතුරු පෞද්ගලික ව ලබා දෙන ලදී.)

5.2.1 2018.04.01 සිට 2022.12.31 දක්වා මතුගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා විසින් අධීක්ෂණය කර ඇති අංශ මොනවාද?

I. ඒ කුමන මන්ත්‍රීවරුන් විසින් ද?
II. සතියට දින කීයද?
III. මාසෙට දින කීයද?වසර කීයද?
IV. ඔවුන් ඒ සඳහා රැකියා කළ ආයතනයෙන් නිවාඩු ලබා ගත්තේ ද?එම නිවාඩු වැටුප් සහිත ද?රහිත ද?
V. ඒ සඳහා ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් මොනවාද?ඒ පිළිබඳ සටහන් තිබේද? (පිළිතුරු පෞද්ගලික ව ලබා දෙන ලදී.)

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**6.1 ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

6.1.1 2018.04.10 දින මහ සභාවේ 5.1.8 යෝජනා සම්මුතිය අනුව ආවරණ අනුමැතියට යටත් ව මා වෙත පැවරී ඇති බලතල අනුව 2022.12.01 දින සිට 2022.12.31 දින දක්වා කරන ලද පහත ගෙවීම් සහා අනුමැතියට ගරු සභාවට යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**<u>2022 දෙසැම්බර් මස ගෙවීම් විස්තර</u>**

| අනු අංකය | නම | වව්චර් අංකය | විස්තරය | මුදල |
|---|---|---|---|---|
| | **2022.12.01** | | | |
| 01 | ප්‍රජා සංවර්ධන නිලධාරි - | 01 | කොම්පෝස්ට් හලන යන්ත්‍රය රැගෙන ඒම අත්තිකාරම් පියවීම | 45000.00 |
| 02 | දසුන් උපේන්ද්‍ර කළුතරගේ | 02 | පොහොර ඇසුරුම් කිරීමට 50kg පොලිසැක් බෑග් 417 ක් මිලට ගැනීම | 35445.00 |
| 03 | ඩයලොග් ආසියා පුද්ගලික සමාගම | 03 | හෝරා ස්ථම්භය CCTV කැමරා හා 4G රවුටරය මාසික ගාස්තු | 554.44 |
| 04 | ආර්.ජී.අයි.එස්. රාජපක්ෂ | 04 | පරිසර මිතුරෝ වැඩසටහන දිවා ආහාරය සැපයීම | 33430.00 |
| 05 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 05 | RB - 2267 අළුත්වැඩියාව | 46500.00 |
| 06 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 06 | 49 8605 අළුත්වැඩියාව | 9800.00 |
| | **2022.12.02** | | | |
| 07 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 07 | ඉන්ධන මුදල් ගෙවීම (පොදු ගබඩාව සඳහා) | 172000.00 |
| 08 | සී/ස මතුගම වි.සේ.ස. සමිතිය | 08 | ඉන්ධන මුදල් ගෙවීම ZA-2657 ඩීසල් 60L | 25800.00 |
| 09 | සී/ස මතුගම වි.සේ.ස. සමිතිය | 09 | ඉන්ධන මුදල් ගෙවීම ZA-0452 ඩීසල් 60L | 25800.00 |

| | | | | |
|---|---|---|---|---|
| 10 | ලංකා පිරවුම්හල - යටදොලවත්ත | 10 | ඉන්ධන මුදල් ගෙවීම LL-7050 ඩීසල් 30L | 12900.00 |
| | **2022.12.05** | | | |
| 11 | ලංකා පිරවුම්හල - යටදොලවත්ත | 11 | ඉන්ධන මුදල් ගෙවීම - ඇමුණුම 01 | 227000.00 |
| 12 | සී/ස මතුගම - වි.සේ.ස. | 12 | ඉන්ධන මුදල් ගෙවීම RF-1964 ඩීසල් 30L | 12900.00 |
| 13 | ෆැමිලි එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ් | 13 | 37.5Kg ගෑස් සිලින්ඩර් 15 ක් මිලදී ගැනීම | 268875.00 |
| 14 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් | 14 | ඩුප්ලෝ යන්ත්‍ර සඳහා තීන්ත 4 ක් මිලදී ගැනීම | 33824.00 |
| | **2022.12.06** | | | |
| 15 | එච්.ඒ. කසුන් ප්‍රියංකර | 15 | ආඳවල ගොඩදෙණියවත්ත ජලනල එළීම තැන්පත් මුදල් ආපසු ගෙවීම | 5000.00 |
| 16 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 16 | පොදු ගබඩාව සඳහා ඉන්ධන ලබා ගැනීම | 121000.00 |
| 17 | ජයසිරි එන්ටර්ප්‍රයිසස් | 17 | යටදොල තණකොළ කපන යන්ත්‍රය උපාංග මිලදී ගැනීම | 5865.00 |
| 18 | ජයසිරි එන්ටර්ප්‍රයිසස් | 18 | වැලිපැන්න චෙන්සෝ යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා උපංග මිලට ගැනීම | 11520.00 |
| 19 | රසික මෝටර්ස් | 19 | එල්.එම්. - 5610 සයිරන් නළාවක් මිලට ගැනීම | 1898.00 |
| 20 | සාලිය මෝටර්ස් | 20 | RD - 6657 බ්‍රේක්, ක්ලච් පද්ධතිය අලුත්වැඩියාව | 122550.00 |
| 21 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් | 21 | RY - 2228 ට්‍රේලරය මාස 3 කට රක්ෂණය කිරීම | 3644.11 |
| 22 | පහන් ඉලෙක්ට්‍රිකල්ස් | 22 | 1.044 වයර් රෝල් 50 ක්, 2 Pin holder හා තම්ලර් ස්විච් 250 ක් ලබා ගැනීම | 443750.00 |
| 23 | සහකාර කළමණාකරු / ඉංජිනේරු අළුත්ගම ඩිපෝව | 23 | LJ - 9413, RD - 6657, LJ - 6098 ඉංජිනේරු වාර්තා ලබා ගැනීම | 4000.00 |
| 24 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 24 | ඔරලෝසු කණුව CCTV කැමරා පද්ධතිය ගාස්තු ගෙවීම | 5343.54 |
| 25 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 25 | දුරකථන ජාල බිල්පත | 63658.78 |
| 26 | ස්පාක්ලිට් මෝටර් ට්‍රේඩර්ස් | 26 | ZA - 0452 බකට් එකට ඇණ 10 නට් 10 සවි කිරීම | 3500.00 |
| 27 | අගලවත්ත මෝටර්ස් | 27 | ZA - 0452 ඉදිරිපස හා පසුපස දත් හා ඇණ සවි කිරීම | 42310.00 |
| 28 | සෝෆාස්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 28 | ABP - 5527 ඉදිරිපස විල් බ්‍රකට් හා මීටර් කේබලය සවි කිරීම | 4800.00 |

| | | | | |
|---|---|---|---|---|
| 29 | සෝෆාස්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 29 | QQ - 1984 බ්‍රේක් පොම්පය අලුත්වැඩියාව | 2140.00 |
| 30 | එම්.ඩබ්. නානායක්කාර | 30 | බේල් යන්ත්‍රය හයිඩ්‍රොලික් ඔයිල් 30L | 36000.00 |
| | **2022.12.09** | | | |
| 31 | අර්ජුන කිරිඇල්ල | 31 | 2022.11.30 සංග්‍රහ වියදම් පියවීම | |
| 32 | පී.එස්.කේ. සර්විස් සෙන්ටර් | 32 | RD - 6657 සේවා කිරීම | 26340.00 |
| 33 | ඇතුලත්මුදලිගම ප්‍රජා සහයෝගීතා සමිතිය | 33 | කොම්පෝස්ට් අංගනය ජල බිල්පත් ගෙවීම | 7900.00 |
| 34 | සෙයාරා හාඩ්වෙයාර් ඇන්ඩ් ග්ලාස් | 34 | සාරානන්ද පාර පාලම් පට්ටම් ලබා ගැනීම | 6200.00 |
| 35 | සාලිය මෝටර්ස් | 35 | LJ - 9413 ඩීසල් බ්ලොක්වීම සෑදීම | 8800.00 |
| 36 | කළ්‍යාණි ට්‍රේඩින් | 36 | ගල්මත්ත අත්පන්දු ක්‍රීඩාංගණය අවශ්‍ය ක්‍රීඩා උපකරණ මිලට ගැනීම | 10250.00 |
| 37 | ගුණවර්ධන ගරාජ් | 37 | AAJ - 4210 බ්‍රේක් ලයිනර් සයිලන්සර් පැකින් දැමීම | 12100.00 |
| 38 | චමින්ද ටයර් හවුස් | 38 | PE - 6914 කැබ් රථයට ටයර් 04 ක් මිලදී ගැනීම (255x70x15) | 291000.00 |
| 39 | එම්.ඩබ්. නානායක්කාර | 39 | 20-50 ඔයිල් ලීටර් 03 ක් ගබඩාව සඳහා ලබා ගැනීම | 4200.00 |
| 40 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 40 | LL - 7050, ZA - 0452 ඩීසල් ලීටර් 6 බැගින් ලබා ගැනීම | 50400.00 |
| 41 | මුදල් භාරකරු | 41 | හොරවල උප කාර්යාලය ස්ථිර වැටුප් අත්තිකාරම් | 1500.00 |
| 42 | මුදල් භාරකරු | 42 | 2022 දෙසැම්බර් වැටුප් අත්තිකාරම් - වැලිපැන්න උප කාර්යාලය | 1000.00 |
| 43 | මුදල් භාරකරු | 43 | 2022 දෙසැම්බර් වැටුප් අත්තිකාරම් - මතුගම ප්‍රධාන කාර්යාලය | 13100.00 |
| 44 | මුදල් භාරකරු | 44 | 2022 නොවැම්බර් දෛනික වැටුප් - හොරවල උප කාර්යාලය | 52322.03 |
| 45 | මුදල් භාරකරු | 45 | 2022 නොවැම්බර් ව්‍යාපෘති වැටුප් - හොරවල උප කාර්යාලය | 141063.64 |
| 46 | මුදල් භාරකරු | 46 | 2022 නොවැම්බර් දෛනික වැටුප් - හොරවල උප කාර්යාලය | 29399.91 |
| 47 | මුදල් භාරකරු | 47 | 2022 නොවැම්බර් ව්‍යාපෘති වැටුප් - වැලිපැන්න උප කාර්යාලය | 86165.44 |
| 48 | මුදල් භාරකරු | 48 | 2022 නොවැම්බර් දෛනික වැටුප් අත්තිකාරම් - මතුගම ප්‍රධාන කාර්යාලය | 109383.78 |
| 49 | මුදල් භාරකරු | 49 | 2022 නොවැම්බර් ව්‍යාපෘති වැටුප් - මතුගම ප්‍රධාන කාර්යාලය | 177311.86 |

| | | | | |
|---|---|---|---|---|
| 50 | මුදල් භාරකරු | 50 | 2022 නොවැම්බර් විෂබීජහරණ වැඩසටහන වැඩසටහන වැටුප් | 145586.56 |
| 51 | මුදල් භාරකරු | 51 | 2022 නොවැම්බර් ඩෙංගු මර්ධන වැඩසටහන වැටුප් | 169540.50 |
| 52 | මුදල් භාරකරු | 52 | 2022 නොවැම්බර් එච්.ජී.එන්. තනූජා ඇතුළු 05 කට දීමනා | 650.00 |
| | **2022.12.12** | | | |
| 53 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 53 | ඉන්ධන - ඇමුණුම 02 | 251550.00 |
| 54 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 54 | ඉන්ධන බිල්පත් ගෙවීම පොදු ගබඩාව සඳහා | 151400.00 |
| 55 | ඩබ්.ඩී. සුනිල් ශාන්ත | 55 | 2022 නොවැම්බර් මස නිවාඩු දින වැටුප් | 4523.33 |
| 56 | ජී.ජී. මල්ලිකා | 56 | 2022 ඔක්තෝම්බර් මස අතිකාල | 1477.70 |
| 57 | මුදල් භාරකරු මගින් | 57 | 2022 නොවැම්බර් මස සභික ගමන් වියදම | 75000.00 |
| 58 | මුදල් භාරකරු මගින් | 58 | 2022 දෙසැම්බර් මස සභික දීමනා | 453850.00 |
| 59 | අරුණ බුද්ධික ජිනදාස | 59 | ආදායම් බලපත්‍ර / දුම් සහතික ගැනීම අත්තිකාරම් | 15340.00 |
| 60 | අර්ජුන කිරිඇල්ල | 60 | 2022.12.13 මහ සභා සංග්‍රහ අත්තිකාරම් | 25000.00 |
| 61 | අර්ජුන කිරිඇල්ල | 61 | 2022.12.12 විශේෂ සභාව සංග්‍රහ අත්තිකාරම් | 25000.00 |
| | **2022.12.13** | | | |
| 62 | අර්ජුන කිරිඇල්ල | 62 | තණකොළ කපන යන්ත්‍රයට තංගුස් නූල් | 25000.00 |
| 63 | ටී.ජී. රවීන්ද්‍ර කුමාර | 63 | නවුත්තුඩුව සුහද ප්‍රජා මණ්ඩලයට MM6 සෙට් 20kg මිලදී ගැනීම | 8000.00 |
| | **2022.12.14** | | | |
| 64 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 64 | LL - 7571 ඩීසල් ටැංකිය අළුත්වැඩියාව | 11000.00 |
| 65 | කේ.වී.ඩී. චම්පික රවීන්ද්‍ර | 65 | LED බල්බ 270 මිලට ගැනීම | 445500.00 |
| 66 | ෆැමිලි එන්ටර්ප්‍රයිසස් | 66 | 37.5kg ගෑස් 15 ක් මිලට ගැනීම | 277875.00 |
| 67 | කේ.එම්. කවිඳු හේෂාන් | 67 | 2022.11.20 මහජන ක්‍රීඩාංගණ තැන්පත් | 2000.00 |
| 68 | පී.වී. කපිල | 68 | කසල හැලීමේ යන්ත්‍රය අළුත්වැඩියා කිරීමේ උපකරණ මිලට ගැනීම | 4377.50 |
| 69 | එම්.ඒ. චන්ද්‍රපාල | 69 | කසල හැලීමේ යන්ත්‍රය පැස්සුම් කිරීමේ කුලිය | 12000.00 |
| 70 | අගලවත්ත මෝටර්ස් | 70 | කසල හැලීමේ යන්ත්‍රය අළුත්වැඩියා උපකරණ | 15400.00 |
| 71 | නාමල් හාඩ්වෙයාර් | 71 | මීගම පෙර පාසල ට්‍රිප් ස්විච් 01 | 4300.00 |
| 72 | නදී ක්‍රියේෂන් | 72 | සාහිත්‍ය උත්සවය සහතික මුද්‍රණය | 9000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 73 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | 73 | ශ්‍රවණාගාර ජල බිල්පත් ගෙවීම | 8391.93 |
| | **2022.12.15** | | | |
| 74 | මුදල් භාරකරු / අර්ජුන කිරිඇල්ල | 74 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ලිපි ද්‍රව්‍ය ලබා ගැනීමේ අත්තිකාරම් | 24214.40 |
| 75 | මුදල් භාරකරු / අර්ජුන කිරිඇල්ල | 75 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ඉන්ධන පොත් 50 මිලට ගැනීමේ අත්තිකාරම් | 10350.00 |
| 76 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 76 | ඉන්ධන ලබා ගැනීම - පොදු ගබඩාව සඳහා | 180600.00 |
| 77 | ලංකා පිරවුම්හල - යටදොලවත්ත | 77 | ඉන්ධන බිල්පත් - ඇමුණුම 03 | 46500.00 |
| 78 | මුදල් භාරකරු | 78 | මතුගම ප්‍රධාන කාර්යාලයේ සුළු මුදල් අග්‍රිමය | 24039.00 |
| | **2022.12.16** | | | |
| 79 | කේ.කේ.ඩී.ආර්. සංජීව | 79 | රාජකාරී ගමන් වියදම් | 1970.00 |
| 80 | එල්.ඒ. ගාමිණී | 80 | 2022 නොවැම්බර් මස අතිකාල | 13771.08 |
| 81 | ජේ.ඩී. ප්‍රභාත් කුමාර | 81 | 2022 නොවැම්බර් මස අතිකාල | 17579.88 |
| 82 | ඩී.එල්. ජයතුංග | 82 | 2022 නොවැම්බර් මස අතිකාල | 2292.40 |
| 83 | බී.කේ. සුරාජ් | 83 | 2022 නොවැම්බර් මස අතිකාල | 7093.44 |
| 84 | එස්.ඒ.ඩී. රංගජීව | 84 | 2022 නොවැම්බර් මස අතිකාල | 9722.00 |
| 85 | සී.පී. මුණසිංහ | 85 | 2022 නොවැම්බර් මස අතිකාල | 6902.62 |
| 86 | රංජිත් වීරසිරි | 86 | 2022 ඔක්තෝම්බර් මස අතිකාල | 5735.98 |
| 87 | දමිත් මල්ලවආරච්චි | 87 | 2022 නොවැම්බර් මස අතිකාල | 5436.09 |
| 88 | ජානක රුවන් දයාරත්න | 88 | 2022 නොවැම්බර් මස අතිකාල | 6999.84 |
| 89 | සංජය එරික් ලසන්ත | 89 | 2022 නොවැම්බර් මස අතිකාල | 11187.96 |
| 90 | එම්.ජී ප්‍රදීප් | 90 | 2022 සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර් මස අතිකාල | 3510.36 |
| 91 | ජයන්ත සිල්වා | 91 | 2022 නොවැම්බර් මස අතිකාල | 8764.60 |
| 92 | ඩී.එස්. ගුණරත්න | 92 | 2022 නොවැම්බර් මස අතිකාල | 6162.56 |
| 93 | කේ.වී. අරුණ ශාන්ත | 93 | 2022 නොවැම්බර් මස අතිකාල | 7221.75 |
| 94 | චන්දන පුෂ්පකුමාර | 94 | 2022 නොවැම්බර් මස අතිකාල | 7510.62 |
| 95 | කේ.ඒ. ලසන්ත කුමාර | 95 | 2022 නොවැම්බර් මස අතිකාල | 4010.90 |
| 96 | එම්.කේ. සමන් ජානක | 96 | 2022 නොවැම්බර් මස අතිකාල | 12959.24 |
| 97 | ඊ.එම්. නුවන් චතුරංග | 97 | 2022 නොවැම්බර් මස අතිකාල | 6799.68 |
| 98 | කරුණාලාල් ඇපා | 98 | 2022 නොවැම්බර් මස අතිකාල | 9693.80 |
| 99 | එම්.එච්. සේනාරත්න | 99 | 2022 නොවැම්බර් මස අතිකාල | 9180.00 |
| 100 | ලංකා ටයිල් පුද්ගලික සමාගම | 100 | ගල්මත්ත උප කාර්යාලයේ වැසිකිලිය සඳහා වෝල් ටයිල් 30 ක් මිලට ගැනීම | 24840.00 |
| 101 | රෝයල් සෙරමික් | 101 | ගල්මත්ත උප කාර්යාලයට සින්ක් 01 | 56420.00 |

| | | | | |
|---|---|---|---|---|
| 102 | එලිජන්ට් හෝම්ස් | 102 | ගල්මත්ත උප කාර්යාලයට සින්ක් ටැප් හා බිත්ති කණ්ණාඩි | 7050.00 |
| 103 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 103 | ඉන්ධන පෙට්‍රල් 100 ක් ගැනීම පොදු ගබඩාව සඳහා | 37000.00 |
| | **2022.12.19** | | | |
| 104 | මංගල හාඩ්වෙයාර් | 104 | ගල්මත්ත පෙර පාසල් බිත්ති කපරාරු කිරීම සිමෙන්ති මිටි 05 | 13250.00 |
| 105 | චමින්ද ටයර් හවුස් | 105 | 53-4621 සඳහා 255x70x15 ටයර් 02 ලබා ගැනීම | 146000.00 |
| 106 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 106 | ඉන්ධන ලබා ගැනීම - පොදු ගබඩාව සඳහා | 333480.00 |
| 107 | එෆ්.අයි.එම්. කුමාරසිංහ | 107 | ගල්මත්ත පෙර පාසල කපරාදු කිරීමට වැලි කියුබ් 01 | 18000.00 |
| 108 | කේ.වී. රවිඳු දිල්ෂාන් | 108 | ගොඩවැලි බලපත්‍ර තැන්පත් ආපසු ගෙවීම | 50000.00 |
| 109 | පී.වී. කපිල | 109 | ගල්මත්ත උප කාර්යාල ජල සැපයුම සඳහා අවශ්‍ය උපකරණ | 1260.00 |
| 110 | ඩබ්.ජී. නීරංග පුෂ්පකුමාර | 110 | 2022 නොවැම්බර් මස අතිකාල | 2624.94 |
| 111 | ඩබ්.ජී. නීරංග පුෂ්පකුමාර | 111 | 2022 ඔක්තෝම්බර් මස අතිකාල | 1652.74 |
| 112 | අනුරුද්ධ ඉන්ද්‍රජිත් | 112 | 2022 නොවැම්බර් මස අතිකාල | 9629.00 |
| 113 | කාර්යභාර නිලධාරී හොරවල | 113 | 2022 ඔක්තෝම්බර් මස සංග්‍රහ වියදම් | 1000.00 |
| 114 | නාමල් හාඩ්වෙයාර් | 114 | ශ්‍රවණාගාරයේ ඇතුළත බිම තීන්ත ආලේප කිරීමට තීන්ත, ටිනර්, පින්සල් ලබා ගැනීම | 24520.00 |
| | **2022.12.21** | | | |
| 115 | කළ්‍යාණි ඉලෙක්ට්‍රිකල් ට්‍රේඩින් | 115 | කොම්පෝස්ට් අංගනය Bus Bar Box 01 මිලදී ගැනීම | 14000.00 |
| 116 | කාර්යභාර නිලධාරී වැලිපැන්න | 116 | සුළු මුදල් අග්‍රිමය | 3000.00 |
| 117 | ජී.ජී. මල්ලිකා | 117 | 2022 නොවැම්බර් මස අතිකාල | 1002.72 |
| 118 | කාර්යභාර නිලධාරී හොරවල | 118 | සුළු මුදල් අග්‍රිමය | 2550.00 |
| 119 | පී.වී. කපිල | 119 | වැලිපැන්න උප කාර්යාලයේ ජල සැපයුමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 42145.00 |
| 120 | සුමිත් කුමාර අතුකෝරල | 123 | 2022 නොවැම්බර් මස අතිකාල | 3053.54 |
| 121 | ටී.ජී. අජිත් | 124 | 2022 නොවැම්බර් මස අතිකාල | 3483.15 |
| 122 | ඩී.එච්. ජයන්ත | 125 | 2022 නොවැම්බර් මස අතිකාල | 3588.70 |
| 123 | ප්‍රදීප් රංගනාත් | 126 | 2022 නොවැම්බර් මස අතිකාල | 3060.95 |
| 124 | රන්දික නදීශාන් | 127 | 2022 ඔක්තෝම්බර් මස අතිකාල | 8314.40 |
| 125 | රන්දික නදීශාන් | 128 | 2022 නොවැම්බර් මස අතිකාල | 6564.00 |
| 126 | ප්‍රගීත් ඉන්දික කුමාර | 129 | 2022 නොවැම්බර් මස අතිකාල | 1273.14 |
| 127 | මිහිඳු ජන්න කුමා | 130 | 2022 නොවැම්බර් මස අතිකාල | 4286.94 |

| | | | | |
|---|---|---|---|---|
| 128 | ආර්.පී. වරුණ ඉෂාන්ත | 131 | 2022 නොවැම්බර් මස නිවාඩු දින වැටුප් | 4973.33 |
| 129 | කාර්යභාර නිලධාරී වැලිපැන්න | 132 | සංග්‍රහ වියදම් | 1000.00 |
| 130 | කාර්යභාර නිලධාරී හොරවල | 133 | සංග්‍රහ වියදම් | 1000.00 |
| 131 | කාර්යභාර නිලධාරී හොරවල | 134 | සුළු මුදල් අග්‍රිමය | 3000.00 |
| 132 | කාර්යභාර නිලධාරී හොරවල | 135 | මුද්දර අග්‍රිම පියවීම | 2000.00 |
| 133 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 136 | 53-44621 ඩීසල් ලීටර් 50 ලබා ගැනීම | 21000.00 |
| 134 | ජී.එච්. වසන්ත | 137 | 2022 නොවැම්බර් මස අතිකාල | 2805.30 |
| | **2022.12.22** | | | |
| 135 | ලංකා පිරවුම්හල - යටදොලවත්ත | 138 | ඉන්ධන බිල්පත් - ඇමුණුම 04 | 223250.00 |
| 136 | චමිලා දිලානි | 139 | 2022.11.26 ශ්‍රවණාගාර තැන්පත් ආපසු ගෙවීම | 3000.00 |
| 137 | ඩී.ඒ.ඩී.එන්. කරුණාතිලක | 140 | 2022.11.14 ශ්‍රවණාගාර තැන්පත් ආපසු ගෙවීම | 3000.00 |
| 138 | පී.වී. ප්‍රමෝද් කෞෂල්‍යා | 141 | ශ්‍රවණාගාර මුදල් ආපසු ගෙවීම් | 10500.00 |
| 139 | කසුන් මුණසිංහ | 142 | 2022.12.03 ශ්‍රවණාගාර තැන්පත් ආපසු ගෙවීම | 10000.00 |
| 140 | එච්.කේ. සම්පත් පෙරේරා | 143 | QY - 8371 අලුත්වැඩියාව | 96350.00 |
| 141 | සෝෆාස්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 144 | AAJ - 4210 බ්‍රේක් ලයිනර් සයිලන්සර් පැකින් දැමීම | 3950.00 |
| 142 | ගුණවර්ධන ගරාජ් | 145 | AAJ - 4120 බ්‍රේක් ලයිනර් දැමීම | 500.00 |
| 143 | දිරිය පියස සුභ සාධක සමිතිය හොරවල | 146 | කොම්පෝස්ට් අංගනය පැති කාණුව සකස් කිරීම 10% අතරුදවුම් | 28525.38 |
| 144 | දිරිය පියස සුභ සාධක සමිතිය හොරවල | 147 | කොම්පෝස්ට් අංගනයේ වාහන සේදුම් ස්ථානය 10% අතරුදවුම් | 43479.53 |
| | **2022.12.23** | | | |
| 145 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 148 | ගබඩාව සඳහා පෙට්‍රල් ලීටර් 100 ක් ලබා ගැනීම | 37000.00 |
| 146 | ඇතුලත්මුදලිගම ප්‍රජා සහයෝගීතා සමිතිය | 149 | කොම්පෝස්ට් අංගනය ජල බිල්පත් ගෙවීම | 8500.00 |
| 147 | ලංකා විදුලිබල මණ්ඩලය | 150 | විදුලි බිල්පත් ගෙවීම | 163702.45 |
| 148 | කාර්යභාර නිලධාරී වැලිපැන්න | 151 | මුද්දර අග්‍රිම පියවීම | 2000.00 |
| 149 | කාර්මික කම්වු දීමනා | 152 | 2022 ඔක්තෝම්බර් | 3500.00 |
| 150 | කාර්යභාර නිලධාරී හොරවල | 153 | මුද්දර අග්‍රිමය | 1290.00 |
| | **2022.12.27** | | | |
| 151 | ෆැමිලි එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ් | 154 | 37.5Kg ලාෆ් ගෑස් සිලින්ඩර් 17 ක් මිලදී ගැනීම | 314925.00 |
| 152 | ඇක්සස් ඉංජිනියරින් PLC | 155 | ගල්මත්ත උප කාර්යාලයට කාපට් ටොන් 01 | 24275.06 |

| | | | | |
|---|---|---|---|---|
| 153 | ලේකම් වලල්ලාවිට ප්‍රා.ස. | 156 | ආර්.ජී.ඩී. කාවින්ද මහතාගේ සේවක ණය මුදල් ගෙවීම | 50069.00 |
| 154 | ලංකා පිරවුම්හල - යටදොලවත්ත | 157 | ඉන්ධන බිල්පත් - ඇමුණුම 05 | 174150.00 |
| 155 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 158 | 53-4621 ඩීසල් ලීටර් 55 ලබා ගැනීම | 23100.00 |
| | **2022.12.29** | | | |
| 156 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 159 | ඉන්ධන බිල්පත් | 205000.00 |
| 157 | අර්ජුන කිරිඇල්ල | 160 | 2022.12.30 විශේෂ මහ සභා සංග්‍රහ අත්තිකාරම් | 25000.00 |
| | **2022.12.30** | | | |
| 158 | අර්ජුන කිරිඇල්ල | 161 | පී.පී.ටී. ආරක්ෂිත ඇඳුම් කට්ටල මිලට ගැනීම අත්තිකාරම් පියවීම | 17500.00 |
| 159 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී | 162 | දුම්රිය බිල්පත් ගෙවීම | 14775.00 |
| 160 | විද්‍යාවිලාස මුද්‍රණ ශිල්පියෝ | 163 | දෛනික ලැබීම් ලේඛන 15 ක් මිලදී ගැනීම | 14775.00 |
| 161 | කළ්‍යාණි ට්‍රේඩින් පුද්ගලික සමාගම | 164 | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය මිලට ගැනීම | 85500.00 |
| 162 | විද්‍යාවිලාස මුද්‍රණ ශිල්පියෝ | 165 | ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීම | 74000.00 |
| 163 | පී.වී. කපිල | 166 | මහජන පොළ වහල අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 9400.00 |
| 164 | පී.වී. කපිල | 167 | ශ්‍රවණාගාරය දොර තීන්ත ආලේප කිරීමට අවවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 3060.00 |
| 165 | චමින්ද ටයර් හවුස් | 168 | සභාවේ වාහන සඳහා පැච් දැමීම | 3500.00 |
| 166 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී | 169 | දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම | 7600.00 |
| 167 | ජයසිරි එන්ටර්ප්‍රයිසස් | 170 | මාර්ග අංශය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම | 14875.00 |
| 168 | පී.වී. කපිල | 171 | ආදාහනාගාරය විදුලි සැපයුම සකස් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 7650.00 |
| 169 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 172 | 2022 ඔක්තෝම්බර් යටදොල මහජන පුස්තකාලය පුවත්පත් බිල් ගෙවීම | 11080.00 |
| 170 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 173 | 2022 ඔක්තෝම්බර් නවුත්තුඩුව පුස්තකාලය පුවත්පත් බිල් ගෙවීම | 11920.00 |
| 171 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 174 | 2022 ඔක්තෝම්බර් හේනේගම පුස්තකාලය පුවත්පත් බිල්පත් ගෙවීම | 11080.00 |
| 172 | අරුණ බුද්ධික ජිනදාස | 175 | වාහන ආදායම් බලපත්‍ර ලබා ගැනීම අත්තිකාරම් පියවීම | 15730.00 |
| 173 | ගුණවර්ධන ගරාජ් | 176 | ABU - 3964 ත්‍රී රෝද රථය සේවා කිරීම | 11950.00 |
| 174 | පී.එස්.කේ. සර්විස් සෙන්ටර් | 177 | QY - 8371 සේවා කිරීම | 2100.00 |
| 175 | චමින්ද ටයර් හවුස් | 178 | සභාව සතු වාහන සඳහා පැච් දැමීම | 3150.00 |

| | | | | |
|---|---|---|---|---|
| 176 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජි | 179 | හේනේගම හා ගල්මත්ත ඡායා පිටපත් යන්ත්‍රය සේවා ගිවිසුම් ගාස්තු | 51290.00 |
| 177 | එච්. හෂාන් දිමුතු රූපසිංහ | 180 | ක්‍රීඩාංගණ තැන්පත් ආපසු ගෙවීම | 4000.00 |
| 178 | ඒ.පී.පී. කුමාරි | 181 | 2022.12.30 පුහුණු වැඩසටහන සඳහා අත්තිකාරම් | 9000.00 |
| 179 | ඩී.ආර්. ලක්මාලි | 182 | යටදොල ක්‍රීඩාංගණය වෙන් කිරීම මුදල් හිලව් කිරීම | 3000.00 |
| 180 | බී.කේ. සුරාජ් | 183 | රියදුරු බලපත්‍ර අලුත් කිරීම ගාස්තු | 1550.00 |
| 181 | ඩී.වී. ඉන්දිරා | 184 | 2022 දෙසැම්බර් ගමන් වියදම් | 700.00 |
| 182 | ඩබ්.ජේ. උදයංග | 185 | 2022 දෙසැම්බර් ගමන් වියදම් | 800.00 |
| 183 | ගයාන් මධුසංඛ | 186 | 2022 දෙසැම්බර් ගමන් වියදම් | 1750.00 |
| 184 | එම්.ඩී. නිමල් ශාන්ත | 187 | රියදුරු බලපත්‍ර අලුත් කිරීම ගාස්තු | 2150.00 |
| 185 | ජයබෝධි වැඩිහිටි සමිතිය | 188 | මතුගම ක්‍රීඩාංගණය කුට්ටි ගල් ඇල්ලීම ව්‍යාපෘතිය 10% අතරුදවුම් | 60677.87 |
| 186 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් | 189 | RB - 2267 රක්ෂණය කිරීම | 8480.15 |
| 187 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 190 | 49 - 8605 ට්‍රේලරය අලුත්වැඩියා කිරීම | 98500.00 |
| 188 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 191 | JG - 4546 අලුත්වැඩියාව | 162700.00 |
| 189 | ජේ.ඒ.සී. ඉන්ඩස්ට්‍රීස් | 192 | 3/4 උස හෝස් 01 මිලට ගැනීම | 10500.00 |
| 190 | ගුණවර්ධන ගරාජ් | 193 | QQ - 1984 සේවා කිරීම හා අලුත්වැඩියා කිරීම | 13600.00 |
| 191 | කළ්‍යාණි ට්‍රේඩින් | 194 | පුස්තකාලය සඳහා ස්ටෙප්ලර් මැෂින් 01 ක් මිලට ගැනීම | 3100.00 |
| 192 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 195 | හේනේගම පුස්තකාලයේ 2022 දෙසැම්බර් පුවත් පත් බිල් | 11760.00 |
| 193 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 196 | ඉන්ධන බිල්පත් - ඇමුණුම 06 | 221450.00 |
| 194 | ඩී.එම්.ඒ.අයි. කල්දේරා | 197 | විෂබීජනාශක දියර මිලට ගැනීම | 27825.00 |
| 195 | සහකාර කළමනාකරු විජය පුවත්පත් සමාගම | 198 | 2023 ටෙන්ඩර් දැන්වීම් පළ කිරීම ගාස්තු | 71300.00 |
| 196 | නාමල් හාඩ්වෙයාර් | 199 | කසල වෙන් කිරීමේ යන්ත්‍රය තීන්ත ආලේප කිරීම තීන්ත මිලට ගැනීම | 16400.00 |
| 197 | ඉන්ෆොබිට් ලංකා | 200 | 32G Pen Drive 1 ක් මිලට ගැනීම | 3780.00 |
| 198 | මහජන බැංකුව ඩියුක් වීදිය | 201 | විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවීම | 522968.73 |
| 199 | කළ්‍යාණි ට්‍රේඩින් | 202 | වර්ණ A4 බන්ඩල් 01 ක් මිලට ගැනීම | 3100.00 |
| 200 | කළ්‍යාණි ට්‍රේඩින් | 203 | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය මිලට ගැනීම | 102900.00 |
| 201 | ජල සම්පාදන මණ්ඩලය | 204 | ශ්‍රවණාගාරයට ජලය සැපයීමේ ගාස්තු | 6074.00 |
| 202 | ඉන්ද්‍රා එස් බ්‍රාහ්මණ | 205 | ශ්‍රවණාගාරයට තැන්පත් ආපසු ගෙවීම | 3000.00 |
| 203 | ඩබ්.ඒ. ද සිල්වා මුනුෆැක්චර්ස් | 206 | හෝරා ස්ථම්භය සේවා ගාස්තු ගෙවීම | 65000.00 |
| 204 | ජිනසේන ඇග්‍රිකල්චරල් මැෂිනරි | 207 | ෆැලෑෂරයට තලයක් දැමීම | 7190.00 |

| | | | | |
|---|---|---|---|---|
| 205 | එම්.ඩබ්. නානායක්කාර | 208 | ගබඩාව සඳහා හයිඩ්‍රොලික් තෙල් ලීටර් 20 ක් මිලට ගැනීම | 24000.00 |
| 206 | එම්.ඩබ්. නානායක්කාර | 209 | ගබඩාව සඳහා හයිඩ්‍රොලික් තෙල් ලීටර් 30 ක් මිලට ගැනීම | 30000.00 |
| 207 | ලංකා විදුලිබල මණ්ඩලය | 210 | විදුලි බිල්පත් ගෙවීම | 62579.31 |
| 208 | කාර්යභාර නිලධාරී හොරවල | 211 | 2022 දෙසැම්බර් සංග්‍රහ වියදම් | 1000.00 |
| 209 | කාර්යභාර නිලධාරී වැලිපැන්න | 212 | වගා තරඟ පැවැත්වීමට පළාත් ආණ්ඩුකාරතුමා පැමිණීමේ උත්සවය සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම | 5220.00 |
| 210 | මුදල් භාරකරු | 213 | 2022 වර්ෂයේ තාක්ෂණ කමිටු දීමනා ගෙවීම | 13750.00 |
| 211 | මුදල් භාරකරු | 214 | 2022 වර්ෂයේ මුදල් කමිටු දීමනා ගෙවීම | 9500.00 |
| 212 | ඩබ්.ඩී. සුනිල් ශාන්ත | 215 | 2023 තක්සේරු දැන්වීම් බෙදීම ගාස්තු | 32120.00 |
| 213 | ඩී.එස්. චමිලා ගුණවර්ධන | 216 | 2023 තක්සේරු දැන්වීම් සඳහා ගෙවීම | 6925.00 |
| 214 | ආර්.එම්. සන්දනායක | 217 | 2023 තක්සේරු දැන්වීම් පරීක්ෂා කිරීමේ ගාස්තු | 28952.00 |
| 215 | එස්.එම්. අයෝනා | 218 | 2023 තක්සේරු දැන්වීම් සඳහා ගෙවීම | 14348.50 |
| 216 | ආර්.එල්.පී. කුමාරි | 219 | 2023 තක්සේරු දැන්වීම් සඳහා ගෙවීම | 3350.00 |
| 217 | ආර්.එල්.පී. කුමාරි | 220 | 2023 තක්සේරු දැන්වීම් සඳහා ගාස්තු ගෙවීම | 3150.00 |
| 218 | එස්.ජේ.එම්.එන්.ඩී.එම්. සමරකෝන් | 221 | 2023 තක්සේරු දැන්වීම් සඳහා ගාස්තු ගෙවීම | 5342.50 |
| 219 | මෙරිල් මුණසිංහ ඇතුළු 8 දෙනෙකු සඳහා | 222 | 2022 නොවැම්බර්, දෙසැම්බර් සැලසුම් කමිටු දීමනා | 80000.00 |
| 220 | කාර්යභාර නිලධාරී වැලිපැන්න | 223 | සංග්‍රහ වියදම් පියවීම | 1000.00 |
| 221 | කාර්යභාර නිලධාරී හොරවල | 224 | සංග්‍රහ වියදම් පියවීම | 1000.00 |
| 222 | අර්ජුන කිරිඇල්ල | 225 | කසල හැලීමේ යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා ලබාගත් අත්තිකාරම් පියවීම | 5625.00 |
| 223 | අර්ජුන කිරිඇල්ල | 226 | 2022.12.12 සංග්‍රහ අත්තිකාරම් පියවීම | 19231.42 |
| 224 | අර්ජුන කිරිඇල්ල | 227 | විශේෂ මහ සභාව සඳහා සංග්‍රහ වියදම් පියවීම | 17362.42 |
| 225 | කළමණාකරු මහජන බැංකුව | 228 | බැංකු ගාස්තු | 23.59 |
| 226 | වයි.බී. පෙරේරා | 229 | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ගාස්තු | 3841.00 |
| 227 | කාර්යභාර නිලධාරී හොරවල | 230 | මුද්දර අග්‍රිම පියවීම | 1930.00 |
| 228 | කේ.කේ.ඩී.ආර්. සංජීව | 231 | සාහිත්‍ය උත්සවය අත්තිකාරම් පියවීම | 92704.00 |
| 229 | කාර්යභාර නිලධාරී වැලිපැන්න | 232 | සුළු මුදල් පියවීම | 3000.00 |
| 230 | කේ.කේ.ඩී.ආර්. සංජීව | 233 | ගෙවතු වගාව අත්තිකාරම් පියවීම | 50000.00 |
| 231 | කාර්යභාර නිලධාරී හොරවල | 234 | සුළු මුදල් පියවීම | 3000.00 |
| 232 | අර්ජුන කිරිඇල්ල | 235 | 2022.12.30 සංග්‍රහ වියදම් පියවීම | 19887.35 |

| | | | | |
|---|---|---|---|---|
| 233 | කාර්යභාර නිලධාරී හොරවල | 236 | 2023 තක්සේරු දැන්වීම් පරීක්ෂාව සඳහා ගෙවීම | 11242.00 |
| 234 | එල්.එල්.ඩී.වයි. මනෝරි | 237 | 2023 තක්සේරු දැන්වීම් සඳහා ගෙවීම (පොත් ලිවීම) | 11242.00 |
| 235 | ආර්.පී. සුමුදු ප්‍රියංගනී | 238 | 2023 තක්සේරු දැන්වීම් සඳහා ගෙවීම (පොත් ලිවීම) | 8030.00 |
| 236 | එල්.එල්.ඩී.වයි. මනෝජි | 239 | 2023 තක්සේරු දැන්වීම් සඳහා ගෙවීම | 10743.00 |
| 237 | කාර්යභාර නිලධාරී හොරවල | 240 | 2023 වරිපනම් දැන්වීම් පරීක්ෂාව ගෙවීම | 11638.00 |
| 238 | මුදල් භාරකරු | 241 | සුළු මුදල් පියවීම | 24811.00 |
| 239 | මුදල් භාරකරු | 242 | මුද්දර අග්‍රිම පියවීම | 8000.00 |
| 240 | ඒ.පී.පී. කුමාරි | 243 | සාහිත්‍ය උත්සවය අත්තිකාරම් පියවීම | 21606.00 |
| 241 | ජයලත් ස්ට්‍රෝර්ස් | 244 | 2022.12.22 උත්සවය සඳහා තුවා 10 ක් මිලට ගැනීම | 6500.00 |
| 242 | එම්.එච්.එම්. නිෆ්ලාස් | 245 | 2022 මස් කඩය ටෙන්ඩර් තැන්පත් පියවීම | 256000.00 |
| 243 | ඩී.සී. සුරේෂ් ලක්මාල් | 246 | 2022 මතුගම පුස්තකාලය පුවත්පත් බිල් | 2514.00 |
| 244 | රහුමා ස්ටෝර්ස් | 247 | 2022 නොවැම්බර් මතුගම පුස්තකාලය පුවත්පත් බිල් (දෙමළ) | 1900.00 |
| 245 | ජී.ඩී. මලිත් ඩිල්ෂාන් | 248 | 2022 සැප්තැම්බර්, ඔක්තෝම්බර්, වැලිපැන්න පුස්තකාලය පුවත්පත් බිල් | 25780.00 |
| 246 | ගයාන්ත මයුරංග තෙවරප්පෙරුම | 249 | 2022 නොවැම්බර් නවුත්තුඩුව පුස්තකාලය පුවත්පත් බිල්පත් | 11830.00 |
| 247 | ගයාන්ත මයුරංග තෙවරප්පෙරුම | 250 | 2022 නොවැම්බර් යටදොල පුස්තකාලය පුවත්පත් බිල්පත් | 12930.00 |
| 248 | ඒ.සී.එෆ්. සහිරා | 251 | 2022 ඔක්තෝම්බර් මීගම පුස්තකාලය පුවත්පත් බිල් | 7410.00 |
| 249 | පී.වී. කපිල | 252 | කොස්ගහලන්ද පෙර පාසල ජල සැපයුම් උපකරණ මිලදී ගැනීම | 6215.00 |
| 250 | නාමල් හාඩ්වෙයාර් | 253 | කෝපිවත්ත පෙර පාසල් තීන්ත ආලේප කිරීමට තීන්ත ලබා ගැනීම | 7580.00 |
| 251 | ජුම්මානා එන්ටර්ප්‍රයිසස් | 254 | විදුලි අංශය සඳහා Line Tap 350 ලබා ගැනීම | 163100.00 |
| 252 | ගුණවර්ධන ගරාජ් | 255 | ABP 5504 ත්‍රී රෝද රථය සේවා කිරීම | 15250.00 |
| 253 | ගුණවර්ධන ගරාජ් | 256 | ABU-3966 ත්‍රී රෝද රථය සේවා කිරීම | 14150.00 |
| 254 | ටොයොටා ලංකා පුද්ගලික සමාගම | 257 | PE - 6914 සේවා කිරීම | 54552.49 |
| 255 | කේ.කේ. ඊෂාන් ගයන්ත | 258 | ZA - 2657 A/C පද්ධතිය සෑදීම | 18800.00 |
| 256 | ජේ.ඒ.සී. ඉන්ඩ්‍රස්ට්‍රීස් | 259 | ZA - 0452 JCB බකට් එකට දත් දැමීම | 16000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 257 | මුණසිංහ ඉංජිනියරින් ඇන්ඩ් ඉන්ඩ්‍රස්ට්‍රීස් | 260 | ZA - 0452 ෆෑන් බෙල්ට් එකක් දැමීම | 47450.00 |
| 258 | කේ.පී. නදුන් ද සිල්වා | 261 | ගල්මත්ත පොළ භූමිය වෙන් කිරීම තැන්පත් මුදල් ආපසු ගෙවීම | 5000.00 |
| 259 | ඒ.පී.පී. පුෂ්පා කුමාරි | 262 | පුස්තකාල පුහුණු වැඩසටහන සඳහා ලබා ගත් අත්තිකාරම් පියවීම | 8075.00 |
| 260 | අර්ජුන කිරිඇල්ල | 263 | තංගුස් නූල් ලබා ගැනීමට ලබා ගත් අත්තිකාරම් පියවීම | 23800.00 |
| | **කර්මාන්ත** | | | |
| | **2022.12.15** | | | |
| 261 | චාමර එන්ට්‍රප්‍රයිසස් | 38 | බෙලිවත්තකන්ද පාර ව්‍යාපෘතියේ පයිප්ප ලබා ගැනීම | 1208810.00 |
| | **2022.12.16** | | | |
| 262 | එක්සත් ප්‍රජා මණ්ඩලය ලෙව්වන්දූව | 39 | දූවවත්ත පාර බෝක්කු දමා සංවර්ධනය කිරීම 50% ගෙවීම | 983227.54 |
| | **2022.12.22** | | | |
| 263 | වළගෙදර එකමුතු සුභ සාධක සමිතිය | 40 | කොළැහැකඩ පාර කම්මලකොටුව පාර සංවර්ධනය කිරීම 10% අතරුදවුම් | 36586.88 |
| 264 | මෙත්තා වැඩිහිටි සමිතිය | 41 | කොළඹයාවත්ත හේන්පිට මාර්ගය සංවර්ධනය කිරීම 10% අතරුදවුම් | 174591.79 |
| | **2022.12.30** | | | |
| 265 | හොරවල 794 එක්සත් ප්‍රජා මණ්ඩලය | 42 | මද්දෙගොඩ පාර නිල් නාරා උයන පාර 10% අතරුදවුම් | 47663.91 |
| 266 | හොරවල 794 එක්සත් ප්‍රජා මණ්ඩලය | 43 | සෙන්දනායක මාවත දෙල්ගහවත්ත පාර 10% අතරුදවුම් | 49084.27 |
| 267 | 806 ඉද්දගො නැගෙනහිර ඉසුරු ගොවි සංවිධානය | 44 | ඉද්දගොඩ නැගෙනහිර ධර්මපාලගම චෝගන් වත්ත හරහා මාර්ගය සංවර්ධන කිරීම 10% අතරුදවුම් | 49373.82 |
| 268 | 804 පාන්තිය එකමුතු වැඩිහිටි සමීතිය | 45 | මල මිරිස් කන්ද පාර සංවර්ධනය 10% අතරුදවුම් | 49373.81 |
| 269 | එකමුතු වැඩිහිටි සමීතිය | 46 | උඩුමුල්ල පාර සංවර්ධනය කිරීම 10% අතරුදවුම් | 49373.81 |
| 270 | 806 ඉද්දගොඩ ඉසුරු ගොවි සංවිධානය | 47 | ධර්මපාලගම මාවත සංවර්ධනය කිරීම 10% අතරුදවුම් | 49296.56 |
| 271 | 806 ඉද්දගොඩ ඉසුරු ගොවි සංවිධානය | 48 | රන්වලාගල කන්ද පාර සංවර්ධනය කිරීම 10% අතරුදවුම් | 49366.25 |
| 272 | 806 ඉද්දගොඩ ඉසුරු ගොවි සංවිධානය | 49 | ධර්මපාලගම මාවත සංවර්ධනය කිරීම 10% අතරුදවුම් | 49373.82 |
| 273 | ප්‍රජා ජල ව්‍යාපෘතිය සුභ සාධක සමිතිය | 50 | පීල්ල මාවත සංවර්ධනය කිරීම | 117939.74 |

| | | | | |
|---|---|---|---|---|
| 274 | ප්‍රජා ජල ව්‍යාපෘතිය සුභ සාධක සමිතිය | 51 | හිරිකැටිය තණකොළවත්ත යාය පාර සංවර්ධනය කිරීම 10% අතුරුදවුම් | 98656.73 |
| 275 | ප්‍රජා ජල ව්‍යාපෘතිය සුභ සාධක සමිතිය | 52 | දඩුගොඩවත්ත පාර සංවර්ධනය කිරීම 10% අතුරුදවුම් | 48671.02 |
| 276 | ප්‍රජා ජල ව්‍යාපෘතිය සුභ සාධක සමිතිය | 53 | ධර්මපාලගම මාවත සංවර්ධනය කිරීම 10% අතුරුදවුම් | 49108.72 |
| 277 | 804 පාන්තිය එකමුතු වැඩිහිටි සමීතිය | 54 | සෙනෙවිරත්න මහතාගේ නිවස අසල සිට ඉදිරියට පාර සංවර්ධනය කිරීම 10% අතුරුදවුම් | 49373.81 |
| 278 | 804 පාන්තිය එකමුතු වැඩිහිටි සමීතිය | 55 | හිමදෙනිය බෝධියකන්ස පාර සංවර්ධනය කිරීම 10% අතුරුදවුම් | 49373.87 |
| 279 | 805 මතුගම නැගෙනහිර එකමුතු ග්‍රාම සංවර්ධන සමිතිය | 56 | ජෝර්ජ් වත්ත III පටුමග සංවර්ධනය කිරීම 10% අතුරුදවුම් | 49109.31 |
| 280 | 805 මතුගම නැගෙනහිර එකමුතු ග්‍රාම සංවර්ධන සමිතිය | 57 | වෙල්ගම මාවත සංවර්ධනය කිරීම 10% අතුරුදවුම් | 49422.20 |
| 281 | 806 ඉද්දගොඩ ඉසුරු ගොවි සංවිධානය | 58 | මතුගම ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම 10% අතුරුදවුම් | 281434.90 |
| | **සේවක ණය** | | | |
| | **2022.12.16** | | | |
| 282 | ආර්.එල්.පී. කුමාරි | 82 | ආපදා ණය ගෙවීම | 41678.00 |
| 283 | ඩබ්.ඩී. ධනරංජනී | 73 | ආපදා ණය ගෙවීම | 140600.00 |
| 284 | කේ.වී.ඩී.පී. හරිස්චන්ද්‍ර | 84 | ආපදා ණය ගෙවීම | 157389.00 |
| 285 | ආර්.එච්. ජනිත විශාන් සාලින්ද | 85 | ආපදා ණය ගෙවීම | 140157.00 |
| 286 | එච්.ඩබ්.ඩී. ඉන්දිකා ප්‍රියදර්ශනී | 86 | ආපදා ණය ගෙවීම | 112704.00 |
| 287 | ආර්.එම්.ජී. නුවන්තිකා | 87 | ආපදා ණය ගෙවීම | 250000.00 |
| | **2022.12.20** | | | |
| 288 | කේ.පී. රසාංගිකා ද සිල්වා | 88 | ආපදා ණය ගෙවීම | 143944.00 |

**6.1.2 - යෝජනාව**

මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ''හෝම් ෂොප්''ව්‍යාපෘතියක් සඳහා ස්ථාන 4ක් හඳුනාගෙන මීට පෙර සාකච්ඡා කොට තීරණය කරන ලදී.එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සුදුසු බව සහ තෝරා ගත් සංවිධාන සමඟ ගිවිසුම්ගත වීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

**තීරණය**

මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ''හෝම් ෂොප්''ව්‍යාපෘතියක් සඳහා ස්ථාන 4ක් හඳුනාගෙන මීට පෙර සාකච්ඡා කොට තීරණය කරන ලදී.එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සුදුසු බව සහ තෝරා ගත් සංවිධාන සමඟ ගිවිසුම්ගත වීම සුදුසු බවට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.3 - යෝජනාව**

2022/11/24 දින වලගෙදර මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ සිදු කරන ලද ආහාර වැටලීමේ දී පහේ කණුව,මීගම,දර්ගා නගරය යන ලිපිනයේ පිහිටි රසිකා ස්ටෝස් නැමැති ආයතනය පරීක්ෂා කිරීමේ දී 2011 ආහාර ස්වස්ථතා නියෝග උල්ලංඝනය කරමින් සිදු කරන ලද වරද හේතුවෙන් මතුගම මහේස්ත්‍රාත් උසාවියේ නඩු අංක 90773 යටතේ නඩු පවරන ලදී.චූදිත නිවැරදිකරු බව පැවසූ හෙයින් නඩු විභාගය 2023/06/05 දිනට පැවැත්වීමට නියම කරන ලදී.එදින විභාගයට ගැනීමට නියමිත මෙම නඩුව මෙහෙය වීම සඳහා නීතිඥ මහතෙකුගේ සහාය ලබා දෙන මෙන් ගරු සභාවෙන් කාරුණික ව ඉල්ලා සිටිමි.

**තීරණය**

2022/11/24 දින වලගෙදර මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ සිදු කරන ලද ආහාර වැටලීමේ දී පහේ කණුව,මීගම,දර්ගා නගරය යන ලිපිනයේ පිහිටි රසිකා ස්ටෝස් නැමැති ආයතනය පරීක්ෂා කිරීමේ දී 2011 ආහාර ස්වස්ථතා නියෝග උල්ලංඝනය කරමින් සිදු කරන ලද වරද හේතුවෙන් මතුගම මහේස්ත්‍රාත් උසාවියේ නඩු අංක 90773 යටතේ නඩු පවරන ලදී.චූදිත නිවැරදිකරු බව පැවසූ හෙයින් නඩු විභාගය 2023/06/05 දිනට පැවැත්වීමට නියම කරන ලදී.එදින විභාගයට ගැනීමට නියමිත මෙම නඩුව මෙහෙය වීම සඳහා නීතිඥ මහතෙකුගේ සහාය ලබා දෙන මෙන් ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.4 - යෝජනාව**

දැනට උප කාර්යාල සඳහා ලබා දෙනු ලබන පහත සඳහන් දීමනා ප්‍රමාණවත් නොවන බැවින්,එම දීමනා මුදල් රුපියල් 1000.00 වැඩි කර ලබා දීම සඳහා ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරමි.

| | | දැනට ලැබෙන මුදල |
|---|---|---|
| 1.සංග්‍රහ වියදම් දීමනාව | - | රු.1000.00 |
| 2.සුළු මුදල් අග්‍රිමය | - | රු.3000.00 |
| 3.මුද්දර අග්‍රිමය | - | රු.2000.00 |

**තීරණය**

දැනට උප කාර්යාල සඳහා ලබා දෙනු ලබන පහත සඳහන් දීමනා ප්‍රමාණවත් නොවන බැවින්,එම දීමනා මුදල් රුපියල් 1000.00 වැඩි කර ලබා දීම සඳහා ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.5 - යෝජනාව**

මතුගම පොදු වෙළඳපොළ අංක 24 දරන එළ හරක් මස් කඩය ටෙන්ඩර් කිරීම සඳහා ගරු සභා අනුමැතියට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග මහතා**

මේ නැවත එළ හරක් මස් කඩයක් සඳහාමද ටෙන්ඩර් කරන්නේ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

නැහැ,මේක වෙනත් ව්‍යාපාරයක් සඳහායි ටෙන්ඩර් කරන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

සභාපතිතුමා,මේක නිවැරදි වෙන්න ඕන.මේ යෝජනාව ඔය විදිහට දැම්මාම ඕන කෙනෙකුට පේන්නේ මේක නැවත වතාවක් මස් කඩයකටම ටෙන්ඩර් කරනවා කියලා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේක වහලා තියෙන එක අපරාදේ.ඒ නිසායි ටෙන්ඩර් කරන්න දැම්මේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේ යෝජනාවේ **"එළ හරක් මස් කඩය"** කියන එක ඉවත් වෙලා යෙදෙන්න ඕන.මොකද මේක කලින් යෝජනාවක් දාලා බෙදීමකින් පරාජයට පත් වුණු යෝජනාවක්.
ඒ අනුව,

**6.1.5 - සංශෝධිත යෝජනාව**

මතුගම පොදු වෙළඳපොළ අංක 24 දරන එළ හරක් මස් කඩය වෙනත් ව්‍යාපාරයක් සඳහා ටෙන්ඩර් කිරීමට ගරු සභා අනුමැතියට යෝජනා කරමි.

**තීරණය**
මතුගම පොදු වෙළඳපොළ අංක 24 දරන එළ හරක් මස් කඩය වෙනත් ව්‍යාපාරයක් සඳහා ටෙන්ඩර් කිරීමට ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.6 - යෝජනාව**
2023 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ගරු සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**තීරණය**
ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් 2023 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් එය ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.7 - යෝජනාව**
මතුගම ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික සේවයේ PL ඛණ්ඩයේ පුරප්පාඩු තනතුරු 33ක් පවතින අතර, එදිනෙදා රාජකාරී ඉටුකර ගැනීමේදී ගැටළු රාශියකට මුහුණ පෑමට සිදුව ඇත.පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුනොකරන බැවින්,ශ්‍රම මිළදී ගැනීමේ පදනමින් සේවා අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කරන ලෙස පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/21/PRO/පොදු/2022 හා 2022.12.30 දිනැති ලිපියෙන් දන්වා ඇත.

සභාවේ අත්‍යාවශ්‍ය සේවා සැපයීමට අවශ්‍යවන පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රම මිළදී ගැනීමේ පදනම යටතේ බඳවා ගැනීම් සුදුසු යැයි යෝජනා කරමින් සභා අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරමි.

- නුපුහුණු කම්කරු (පිරිමි) 06
- තාර දැමීම සඳහා පුහුණු කම්කරු (පිරිමි) 02
- පැය 12ක සේවය සඳහා මුරකරු (පිරිමි) 07
- රියදුරු තනතුරු 02

**තීරණය**
මතුගම ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික සේවයේ PL ඛණ්ඩයේ පුරප්පාඩු තනතුරු 33ක් පවතින අතර, එදිනෙදා රාජකාරී ඉටුකර ගැනීමේදී ගැටළු රාශියකට මුහුණ පෑමට සිදුව ඇත.පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුනොකරන බැවින්,ශ්‍රම මිළදී ගැනීමේ පදනමින් සේවා අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කරන ලෙස පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/21/PRO/පොදු/2022 හා 2022.12.30 දිනැති ලිපියෙන් දන්වා ඇත.

සභාවේ අත්‍යාවශ්‍ය සේවා සැපයීමට අවශ්‍යවන පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රම මිළදී ගැනීමේ පදනම යටතේ බඳවා ගැනීම් සුදුසු යැයි යෝජනා කරමින් සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සභා සම්මත විය.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

දැනට මුර සේවයේ පුරප්පාඩු සඳහා තියෙන තනතුරුත් අපි මේකට යොදවනවා.දැනට අපේ මාර්ග අංශයේ සහ සෞඛ්‍ය අංශයේ ක්ෂේත්‍ර කම්කරු ඉන්න අය දහවල් කාලයේ වැඩ කරලා රාත්‍රී කාලයේ මුර සේවයේ ඉන්නවා. පුරප්පාඩු නැති නිසා මේ සේවකයින්ව සේවයේ යෙදෙව්වාට විශාල පාඩුවක් වෙනවා.මේ වගේ ශ්‍රම පදනම මත සේවයට ගන්න විශේෂ ව්‍යාපෘතියක් අවශ්‍ය වෙන්නේ නැහැ.මේක අනුමැතිය සඳහා යවන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මේක දෛනික චෙක් රෝලෙන් ගෙවන්න පුළුවන්.

## 6.1.8 - යෝජනාව

ප්‍රජා මණ්ඩල 19ක් සඳහා බුෆේ කට්ටල ලබා දීම සඳහා වන ඇස්තමේන්තුව සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

| අනු අංකය | කාරණය | වියදම |
|---|---|---|
| 01 | ප්‍රජා මණ්ඩල 01ක් සඳහා බුෆේ කට්ටලයක් ලබා දීමට දරණ වියදම | රු.55,000.00 |
| 02 | ප්‍රජා මණ්ඩල 18ක් සඳහා රු.55,000.00 බැගින් බුෆේ කට්ටල ලබා දීමට වැය වන මුදල රු.55,000.00X18 | රු.990,000.00 |
| 03 | වෙනත් වියදම් | රු.10,000.00 |
| | මුළු වියදම | රු.1,000,000.00 |

<u>මතුගම ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රජා මණ්ඩල</u>

| අනු අංකය | ප්‍රජා මණ්ඩලය | ග්‍රාම සේවා වසම |
|---|---|---|
| 01 | ශ්‍රී සුගත ප්‍රජා මණ්ඩලය | 803 නාරවිල |
| 02 | එක්සත් ප්‍රජා මණ්ඩලය | 792 ඒ ලෙව්වන්දුව බටහිර |
| 03 | සුහද ප්‍රජා මණ්ඩලය | 796 නවුත්තුඩුව |
| 04 | ශාන්ත පීටර්වත්ත ප්‍රජා මණ්ඩලය | 802 සී යටදොළවත්ත නැගෙනහිර |
| 05 | මිතුරු සවිය ප්‍රජා මණ්ඩලය | 771 බී තල්ගස්ගොඩ |
| 06 | සුහද ප්‍රජා මණ්ඩලය | 795 ඒ බදුගම |
| 07 | අරුණළු ප්‍රජා මණ්ඩලය | 794 සී හොරවල බටහිර |
| 08 | දීප්ති ප්‍රජා මණ්ඩලය | 802 සී දියගල |
| 09 | දිලෙනතරු ප්‍රජා මණ්ඩලය | 802 ඒ බෝපිටිය බටහිර |
| 10 | ශ්‍රම ශක්ති ප්‍රජා මණ්ඩලය | 803 ඒ හේනේගම |
| 11 | විජය ප්‍රජා මණ්ඩලය | 774 වලගෙදර උතුර |

| | | |
|---|---|---|
| 12 | එක්සත් ප්‍රජා මණ්ඩලය | 794 හොරවල |
| 13 | ශක්ති ප්‍රජා මණ්ඩලය | 805 බී මතුගම උතුර |
| 14 | සමගි ප්‍රජා මණ්ඩලය | 805 ඒ මතුගම බටහිර |
| 15 | වීර ප්‍රජා මණ්ඩලය | 772 ඉදිගස්තුඩුව |
| 16 | ගැමුණු ප්‍රජා මණ්ඩලය | 771 බොන්දුපිටිය |
| 17 | පැරකුම් ප්‍රජා මණ්ඩලය | 771 බී කීරන්තිඩිය |
| 18 | සිරි සුගත ප්‍රජා මණ්ඩලය | 797 කීරන්තිඩිය |
| 19 | මයුර ප්‍රජා මණ්ඩලය | 795 ඕවිටිගල |

**<u>තීරණය</u>**

ප්‍රජා මණ්ඩල 19ක් සඳහා බුෆේ කට්ටල ලබා දීම සඳහා වන ඇස්තමේන්තුව සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් සිරිවර්ධන මහතා**

ඔබතුමා අතිරේක න්‍යාය පත්‍රයට ඉදිරිපත් කළ යෝජනා සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු හැටියට අපි මේ අවස්ථාවේ අදහස් දක්වන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.6.1.7 ශ්‍රම මිලදී ගැනීමේ පදනම යටතේ සේවකයින් බඳවා ගැනීම් සහ 6.1.8 ප්‍රජා මණ්ඩල සඳහා බුෆේ කට්ටල ලබාදීම යන යෝජනා දෙක සම්බන්ධයෙන් අදහස් දක්වනවා නම් මේ වෙලාවේ අපි මැතිවරණ අපේක්ෂකයින්.ඔබතුමාගේ අත්සනින් පෙබරවාරි 6 වෙනිදා වෙනකොට පළාත් පාලන ආයතන සම්බන්ධයෙන්,පළාත් පාලන ආයතනවල මුදල්, පළාත් පාලන ආයතනවල රජයේ දේපල,පළාත් පාලන ආයතනවල පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳව පළාත් පාලන කොමසාරිස්වරයා විසින් චක්‍රලේඛන ගහලා තියෙනවා.අපට චක්‍රලේඛන නිකුත් කරලා තියෙනවා.නිවේදන දැනුම් දෙන අවස්ථාවේදීත් ඒ චක්‍රලේඛන පිළිබඳව සඳහන් කළා.

ඒ වගේම අපේ ගරු මන්ත්‍රීතුමන්ලා බොහෝ වෙලාවට දීර්ඝ කාලයක් තිස්සේ තම තමන්ගේ කොට්ඨාශවලට ලැබෙන්න ඕන දේවල් මේ විදියට ලබාදෙන්න කියලා කියා සිටිනවා. එක අවස්ථාවක සලකා බලන්නේ නැතිව දිගින් දිගටම මතු කරන මේ යෝජනා ඉතාම හදිස්සියෙන් දැන් සභාවට යොමු කරන බවක් තමයි අපිට පේන්නේ.විශේෂයෙන්ම අපි ප්‍රධාන පරිපාලන නිලධාරියා වශයෙන් ලේකම්තුමියටත් කියනවා අතිරේක න්‍යාය පත්‍රයන් අපට ලැබෙනවා. නමුත් අතිරේක න්‍යාය පත්‍රය හරහා මේ විදිහට කරුණු රාශියක් ඉදිරිපත් කළාම අපට යෝජනා පිළිබඳව විමර්ශනය කරන්න කරුණු දක්වන්න අවස්ථාවක් නැහැ.යම්කිසි හදිසි අවස්ථාවකදී යෝජනාවන් එකක් දෙකක් අතිරේක න්‍යාය පත්‍රයකට යෙදුවාට අපි විරුද්ධ නැහැ.මේ යෝජනාවන් පිළිබඳව නිසි අධ්‍යයනයක් කරලා තොරතුරු සොයා බලා කරුණු දක්වන්න තියෙන්නේ.මෙවැනි විශාල යෝජනා සංඛ්‍යාවක් අතිරේක න්‍යාය පත්‍රයට යෙදුවාම අපි කොහොමද සොයා බලා කරුණු ඉදිරිපත් කරන්නේ.ඒ පිළිබඳව හොයා බලන්න අපිට බැහැ.

එක පැත්තකින් පළාත් පාලන ආයතනවලට සල්ලි නැහැ කියනවා. රජයට සල්ලි නැහැ කියනවා.පළාත් සභාවට සල්ලි නැහැ කියනවා.

අපි හැමෝම පළාත් පාලන මැතිවරණයක් අභියස මේ ඉන්නේ.අපි හැමෝම පළාත් පාලන මැතිවරණ අපේක්ෂකයන්.ඊට පස්සේ මේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් කීදෙනෙක් එයිද දන්නේ නැහැ.කාට එන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ.හැබැයි මේ ආයතන පවතිනවා. එනිසා කලබලයට මේවා කරන්න ඕන වැඩ කියලා අපි දකින්නේ නැහැ. ප්‍රශ්නේ තියෙන්නේ පළාත් පාලන මැතිවරණය හා සම්බන්ධ

චක්‍රලේඛනවලට නීතිරීතිවලට මේවා කොතෙක් දුරට බලපානවා ද කියලා.ඇයි මේ හදිසියේ මේවා කරන්නේ.එ නිසා සභාපතිතුමා යම් ආකාරයකින් ඉදිරිපත් කරන මේ යෝජනා සම්මත වුණත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් දෙපළ හැටියට අපි මේ යෝජනාවට එකඟ නැහැ.ඒ වගේම යම් අවස්ථාවක මේවා ගෙවන්න වුණොත් ඒ වගකීම මෙතන ඉන්න මන්ත්‍රීවරුන්ට භාර ගන්න වෙයි.ඒ නිසා මේ යෝජනාව පිළිබඳව සලකා බලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.මේවා සම්මත වුණොත් අපි මේ යෝජනාවලට විරුද්ධයි කියලා සඳහන් කරන්න. වෙන දෙයක් නිසා නෙමෙයි,මැතිවරණයක් අභියස මේ මැතිවරණයට සූදානම් වෙන අය වශයෙනුයි. එනිසා අපේ විරුද්ධතාවය ප්‍රකාශ කරන මෙන් කියා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග මහතා**
6.1.7 සහ 6.1.8 යෝජනා සම්බන්ධයෙන් මම බෙදීමක් ඉල්ලනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
තාම මේ යෝජනා සම්මත වුණේ නැහැ. එනිසා බෙදීමක් ඉල්ලන්න බැහැ.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
අතිරේක න්‍යාය පත්‍රයට දාලා තියෙන යෝජනා සංඛ්‍යාව වැඩියි.කියවලා අදහස් දක්වන්න අවස්ථාවක් නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මම කාලය ඉතුරු කරගන්න මේක කළේ.මම එහෙනම් මේ යෝජනාවලට එකින් එක කතා කරන්න අවස්ථාව දෙන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
ඔබතුමා හදිසි අවශ්‍යතාවයකදී අතිරේක න්‍යාය පත්‍රයට යෝජනා එකක් දෙකක් ඉදිරිපත් කලාට අපි විරුද්ධ වෙන්නේ නැහැ. අපි කියන්නේ එකවර මෙවැනි යෝජනා විශාල සංඛ්‍යාවක් යෙදීම සම්බන්ධව යි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මම ප්‍රජා මණ්ඩල යෝජනාව සම්බන්ධව අදහස් ඉදිරිපත් කරන්නේ.අපට පසුගිය අවුරුදු එකහමාරක් තිස්සේ වියදම් චක්‍ර ලේඛනයක් මගින් අපේ වැඩකටයුතු සීමා වුණා. නැවත වියදම් චක්‍රලේඛනයක් ආවා සභා අරමුදලින් ආදායම් රැස් කරන මුදලෙන් සභාවේ කටයුතු කරගෙන යන්න කියලා. එතකොට අපි ඒක සභාවට ඉදිරිපත් කළා.මැතිවරණය පිළිබඳ සියලුම නීතිරීතිවලට අපි යටත්. මේ චක්‍රලේඛනයන් මේ සභාවේ කියෙව්වා. එතකොට සභාපතිවරයා වශයෙන් මට සහ මැතිවරණ අපේක්ෂකයන් වශයෙන් මෙතන ඉන්න අනිත් මන්ත්‍රීවරුන්ටත් සභාවේ දේපළත් එක්ක දේශපාලන වැඩ කරන්න බැහැ.අපි එහෙම කරන්නෙත් නැහැ.

අපි මේ අයවැය චක්‍රලේඛනයෙහි සඳහන් සියලුම යෝජනා මැතිවරණ දෙපාර්තමේන්තුවට දැනුම් දීලා තියෙනවා.අපි ඒවා වසර අවසානයේ කරගෙන යනවා.තාම මැතිවරණය පටන් අරගෙනවත් නැහැ.මගේ නිල රථය සම්බන්ධව ප්‍රශ්නයක් තියෙනවා.මම නිල රථයෙන් දේශපාලන වැඩවලටවත් යන්නේ නැහැ.එක එක්කෙනා එක එක මත වාදවල ඉන්නවා.මැතිවරණ කටයුතු ආරම්භ කරපු අපේක්ෂක මහත්වරු ඉන්නවා.නමුත් මතුගම එහෙම දෙයක් අපට පේන්නෙ නැහැ. මන්ත්‍රීතුමා කියන දේ හරි.ප්‍රජා මණ්ඩල හෝ මේ දේවල් පිළිබඳව ලේකම්තුමිය දැනුවත් කළාම ලේකම්තුමිය වියදම් චක්‍ර ලේඛනයට අනුගත වෙන විදිහට මේ දේවල්වලට අපට සහාය දෙනවා.

මමත් කුමන අවස්ථාවකදීවත් ලේකම්තුමියව අභිබවා ගිහින් නැහැ.අපි මේක අනුමත කරගෙන යනවා. කරන්න තියෙන මූලික වැඩකටයුතු කරගෙන යනවා.ඡන්දයක් පිළිබඳව ප්‍රශ්නයක් ආවොත්

අපි ඒක මැදිහත්වෙලා විසඳගමු.මේවා දැනුම් දුන්නාම ඒ අනුමැතිය දෙන ඒවාටත් යන්නේ නිලධාරීන් තමයි.මේ සියලුම කටයුතු කරන්න යන්නේ නිලධාරීන් ම යි. අපි දැනට මාර්ග කිහිපයකුත් නඩත්තු කරගෙන යනවා.අපේ මාර්ගවල ගමන් කරන්න බැහැ.ජලසම්පාදන මණ්ඩලයේ ව්‍යාපෘති නිසා අපේ මාර්ග විනාශ වුණා.ඡන්ද පෙට්ටියක්වත් ගෙනියන්න සුදුසු තත්ත්වයෙන් නැති නිසා අපි ඒ මාර්ග ප්‍රතිසංස්කරණය කළා. අපි මේවා අවබෝධයෙන් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

6.1.17 සහ 6.1.18 යෝජනා සම්බන්ධයෙන් මගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. මොකක්වත් නිසා නෙමෙයි.පසුගිය සභාවේ දී ප්‍රජා මණ්ඩල පිළිබඳව ඉදිරිපත් කළ අවස්ථාවේ දී මම ගිහින් ප්‍රජා සංවර්ධන නිලධාරී සංජය මහතාව හමු වුණා.මේ වර්ෂය සඳහා ප්‍රජා මණ්ඩල කීයක් ලියාපදිංචි අලුත් කරලා තියෙනවද කියලා මම ඇහුවා.ඒ අවස්ථාව වෙනකොටත් ලියාපදිංචිය අලුත් කළ ප්‍රජා මණ්ඩල හතරයි තිබුණේ.අනිත් එක ප්‍රජා මණ්ඩලයක්වත් ලියාපදිංචිය අලුත් කරලා තිබුණේ නැහැ.මම ඉල්ලීමක් කරනවා මේ යෝජනාව සම්බන්ධයෙන් කාරක සභාවක් පත් කරලා මේ නිලධාරියාව මෙතනට ගෙන්නලා මේ යෝජනාව සම්බන්ධව සාකච්ඡාවක් කරන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

අද ඒ නිලධාරියා මේ සභාවේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

මේ නිලධාරියා අපේ සභාවේ සේවය කරනවා. ඒ වගේම මදුරාවල ප්‍රාදේශීය සභාවේත් සේවය කරනවා.මේ වගේ ලක්ෂ 10ක යෝජනාවක් යොදද්දී සැලකීමෙන් බලන්න ඕන.මේ යෝජනාව මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන දේශපාලන ගුණ්ඩුවක්.මේ යෝජනාව සම්බන්ධව විනිවිදව බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

මගේ කොට්ඨාශයේත් ප්‍රජා මණ්ඩලයක් තියෙනවා.ඒක පිහිටුවලා අවුරුදු ගාණක් වෙනවා. මේ සභාවේ මොනවා හරි බඩු වගයක් දුන්නා කියලා කියනවා.මම දන්නේ නැහැ මොනවද කියලා.අඩුම තරමේ අද වෙනකොට එක ප්‍රජා මණ්ඩලයකට හරි මේ වගේ දෙයක් දීලා තියෙන එක හරි වටිනවා.මේ අවස්ථාවේ මේ ලැබෙන ප්‍රතිපාදන හරි වැදගත්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා**

මේක හොඳ යෝජනාවක්. හදිසියක් වුණා ම මේ බුලෝ කට්ටල වේවා ටෙන්ට් වේවා එක් ගමන් වාරයකට ගිහින් එන්න විශාල ඉන්ධන ප්‍රමාණයක් වැය වෙනවා.ඒ නිසා අඩුම තරමේ එක ප්‍රජා මණ්ඩලයකට හරි මෙහෙම දෙයක් දීලා තියෙන එක වටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් කුමාර මහතා**

ප්‍රජා මණ්ඩල කියන්නේ අපේ සභාවත් සමග සෘජුවම කටයුතු කරන ආයතනයක්.මේ යෝජනාව ඉතා හොඳ යෝජනාවක්.මමත් මේ යෝජනාවට කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

සභාවෙන් ප්‍රජා මණ්ඩලවලට දෙන්න තියෙන ඒවා ලබා නොදෙන්න කියලා නෙමෙයි මම මේ කියන්නේ.මැතිවරණය හා සම්බන්ධ චක්‍රලේඛන නිකුත් කරලා තියෙනවා. මේ රටේ තියෙන්නේ මැතිවරණ කාලයක්. කලින් එවපු චක්‍රලේඛන ද වලංගු,දැන් තියෙන චක්‍රලේඛන ද වලංගු? ඉතින් අපි ක්‍රියාත්මක විය යුත්තේ දැන් තියෙන චක්‍රලේඛනවලට අනුව යි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග මහතා**

සමහර මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වල පුටු කොච්චර ප්‍රමාණයක් තියෙනවද? බුලෝ සෙට් කොච්චර තියෙනවද?වෙන්න ඕන දේ හරියට වෙන්නේ නැති නිසයි ප්‍රශ්නේ. මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වල

තියෙන ටෙන්ට්,පුටු,බුෆේ සෙට් තියෙනවා.නිලධාරීන් කිහිප දෙනෙක් අතර මේවා බෙදෙනවා නම් මේ දෙන දේවලින් වැඩක් නැහැ.රට වැටිලා තියෙන වෙලාවේ මිනිස්සුන්ගේ ආර්ථිකය ගොඩනගන්න තියෙද්දි මේවා වැඩක් තියෙනවා ද?මේවා නිවැරදි විදිහට කරන්න ඕන.නැතුව මිනිස්සුන්ට දෙයක් දෙන්න ඕන කියන එක අපි වලක්වන්නේ නැහැ.ඡන්දයක් අත ළඟ කියන එක නෙමෙයි මට තියෙන ප්‍රශ්නේ.මේ සභාවේ සල්ලි නැහැ කියනවා නම් ලක්ෂ දහයක් වියදම් කරලා හරි ටෙන්ට් පුටු දෙන්න හදනවානම් බුෆේ සෙට් දෙන්න යනවනම් ඒකද අපෙන් වෙන්න ඕන. අන්න ඒකටයි අපි විරුද්ධ.මේවා විධිමත් විදිහට කෙරෙන්න ඕන.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වල තියෙනවා කියන එක පිළිබඳව අදහස් පැහැදිලි කරනවානම් ඒ මන්ත්‍රීවරයා සමිතියේ සභාපති නම් ඒවා බෙදලා දෙන්න ඕන නිසා ළඟ ඇති.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග මහතා**

මේ සභාවේ මුදල් පාවිච්චි කරද්දි හරියට පාවිච්චි කරන්න කියන එක පිළිබඳව ඉල්ලීමක් කරනවා.මම මේ යෝජනාවට විරුද්ධ නිසා බෙදීමක් ඉල්ලනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත කුලතුංග මහතා**

ප්‍රජා මණ්ඩලයකට මේ බඩු දුන්නාම මරණයකට හරි මොකකට හරි මටවත් ගන්න බැහැ. සල්ලි බඳින්න ඕන ආපහු ගන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා**

අද තියෙන ඩීසල් වියදමත් එක්ක බැලුවාම දුර තියෙන තැනකට මේ බඩු ගිහින් දාලා එන්න විශාල ප්‍රමාණයක් මුදල් වියදම් වෙනවා.අපිට මෙහෙම මේ විදියට කලින් කරන්න බැරි වුණා.නැතිනම් ඒ විදිහට හැම ප්‍රජා මණ්ඩලයකටම මෙහෙම දීලා තිබුණා නම් මේ වියදම ඉතුරු යි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

සභාවේ මුදල් අපි වියදම් කරන කොට හරියාකාරව වියදම් කරන්න ඕන. මේක හරියට කරන්න ඕන නිසයි මම කිව්වේ ඒ නිලධාරීතුමා ගෙන්නලා මේක කරන්න කියලා. ඒක තමයි හරි විදිහට කරනවා නම් පිළිවෙල.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ඒ කොන්දේසියට යටත් වෙන්න බැරි මේකයි.අපි මේ යෝජනාව අතිරේක න්‍යාය පත්‍රයට දාලා තියෙනවා.මේක අයවැයෙන් ආපු ව්‍යාපෘතියක්.සමිතියක ප්‍රශ්නයක් තියෙනවා නම් ඒක වෙනම විසඳගන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා**

ප්‍රජා මණ්ඩල කියන්නේ ප්‍රාදේශීය සභාව හරහා ලියාපදිංචි වෙලා ක්‍රියාත්මක වෙන සංවිධානයක්.ඇත්තටම මේ ප්‍රජා මණ්ඩලවලට අවශ්‍ය කරන දේවල් සභාව මගින් දීලා තියෙනවා.ඇත්තටම මේකට විරුද්ධ වෙනවා නම් ඒ ඉතාම නොහොබිනා කෙනෙක්. ගමේ මොකක් හරි උවමනාවක් වුණාම ඒ මිනිස්සු සුභසාධක සමිතිවලටත් නැතිනම් ටෙන්ට් එකක් හෝ ලබාගන්න පුළුවන් තැනක් නැහැ.නමුත් ප්‍රජා මණ්ඩලයකට මේ දේවල් දීලා තියෙනවා නම් ඒ අයට දෙන්න පුළුවන්. මම දේශපාලනය ගැන කතා කරනවා නෙමෙයි. මමත් ප්‍රජා මණ්ඩලයේ සාමාජිකයෙක් විතරයි. කුහක කතා කතා නොකර ගමේ ජනතාව වෙනුවෙන් සේවය කරන්න අවස්ථාව ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.සිරිසේන මහතා**

ඇත්තටම මේක හොඳ යෝජනාවක්.අපි ආවේ ගමේ ජනතාවට හිතවතාට සේවයක් කරන්න.මේක මීට කලින් කරන්න වුණා නම් තවත් හොඳයි.මේක ගමේ ජනතාව වෙනුවෙන් මේ අවස්ථාවේ හරි ඉටු කරන එක බොහොම හොඳ යි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

එහෙනම් 6.1.7 ශ්‍රම මිළ දී ගැනීමේ පදනම යටතේ බඳවා ගැනීම් සුදුසු බවට කරන ලද යෝජනාවට සහ 6.1.8 ප්‍රජා මණ්ඩල සඳහා බුෆේ කට්ටල ලබා දීම සඳහා වන යෝජනාවට ඡන්දය විමසමු.

**<u>ශ්‍රම මිළ දී ගැනීමේ පදනම යටතේ බඳවා ගැනීම් සුදුසු බවට කරන ලද යෝජනාවට සහ ප්‍රජා මණ්ඩල සඳහා බුෆේ කට්ටල ලබා දීම සඳහා වන යෝජනාවට අදාළ ඡන්ද විමසුම.</u>**

**<u>පක්ෂ ව ඡන්දය ලබා දුන් සංඛ්‍යාව - 20</u>**

| | | | | |
|---|---|---|---|---|
| 1. | ලෙව්වන්දුව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා | - | ගරු සභාපති | - පක්ෂයි |
| 2. | රණසිංහ ආරච්චිගේ දොන් ලලිත් රණසිංහ මහතා | - | ගරු උප සභාපති | - පක්ෂයි |
| 3. | ලලිත් නිශාන්ත කුලතුංග මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 4. | මද්දුමගේ දොන් අතුල මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 5. | කත්‍රිආරච්චිගේ කාන්ත සිරිවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 6. | කසුන් හිරෝෂණ මුණසිංහ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 7. | චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 8. | වික්‍රමආරච්චිගේ කමිල් කුමාර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 9. | සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 10. | කාලංවිදූරගේ මිත්‍රානන්ද මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 11. | ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 12. | සංජේ එරංග කරවිට මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 13. | ප්‍රේමරත්න නාකන්දල මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 14. | මොතිලාල් සාන්තප්‍රිය රණවීර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 15. | සීතා ඩයස් ජයසිංහ මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 16. | පන්නිල විතානගේ පුෂ්පා නන්දනී මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 17. | සම්පතා වඩුගේ තුසිතා ප්‍රියංගනී මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | -පක්ෂයි |
| 18. | අබ්දුල් මොහොමඩ් රම්සාන් මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 19. | තුඩුගලගේ දොන් රෝහිත මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 20. | මද්දගේ හින්ටන් ගුණසිරි මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |

**<u>විපක්ෂ ව ඡන්දය ලබා දුන් සංඛ්‍යාව- 05</u>**

| | | | | |
|---|---|---|---|---|
| 01. | ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - විපක්ෂයි |
| 02. | කරුණාමුණි ප්‍රසාදික නඳුන් ද සිල්වා මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - විපක්ෂයි |
| 03. | සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - විපක්ෂයි |
| 04. | නිමාලක සුරංග විමලසූරිය මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - විපක්ෂයි |
| 05. | සුරේෂ් දර්ශන ජයසේකර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - විපක්ෂයි |

**<u>ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව - 02</u>**

| | | | | |
|---|---|---|---|---|
| 01. | සුජීව නිර්මාණ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - වැළකී සිටි |
| 02. | මුල්ලේ විතානගේ ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - වැළකී සිටි |

නොපැමිණි සංඛ්‍යාව - 07

01. විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
02. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
03. නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. පුබුදු මධුරංග ජයනෙත්ති මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. ධම්මික නිර්මාල් විජේසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. නිලූකා දර්ශනී සිල්වා මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
07. දෝන ලීලා මුණසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

**ඒ අනුව 6.1.7 ශ්‍රම මිළ දී ගැනීමේ පදනම යටතේ බඳවා ගැනීම් සුදුසු බවට කරන ලද යෝජනාව සහ 6.1.8 ප්‍රජා මණ්ඩල සඳහා බුෆේ කට්ටල ලබා දීම සඳහා වන යෝජනා වැඩි ඡන්ද 15 න් සභා සම්මත විය.**

## 6.1.9 - යෝජනාව

මතුගම ප්‍රාදේශීය සභා ස්ථාවර වත්කම් ලේඛනයේ කාර්යාල උපකරණ,පිරියත,ලී බඩු උපකරණ,යන්ත්‍ර,පරිගණක අයිතම යටතේ ඇමුණුමේ සඳහන් පරිදි ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව ඉවත් කර ඇති නමුත් 1992 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් ඉදිරියට ගෙන එන ලද ශේෂය නිවැරදි කිරීම විගණනය විසින් ද පෙන්වා දී ඇති බැවින් 2022.12.31 දිනට අවසන් මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීම සඳහා ගරු සභාවේ අනුමැතියට ඉදිරිපත් කරමි.

### ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම

**2010 වර්ෂයේ සිට මේ දක්වා භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ පරිදි ඉන්වෙන්ට්‍රි ලේඛන 01 හා 02 අනුව සටහන් කර ඇති වෙන්දේසි කරන ලද වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීම.**

**01.**කාර්යාල උපකරණ

| අනු අංකය | වර්ෂය | කාර්යාලීය උපකරණ | ප්‍රමාණය | වටිනාකම(රු.) | වෙනත් |
|---|---|---|---|---|---|
| 1 | 1992 | වානේ කබඩ් | 5 | 19,750.00 | වෙන්දේසි කර ඇත.ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 04 සටහන් කර ඇත. |
| 2 | 1992 | දොර 4 ෆයිල් කැබිනට් | 6 | 26,700.00 | වෙන්දේසි කර ඇත.ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 04 සටහන් කර ඇත. |
| 3 | 1992 | වානේ ලියන මේස | 2 | 10,700.00 | 01ක් වෙන්දේසි කර ඇත.2014 භාණ්ඩ සමීක්ෂණය අනුව ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 07 සටහන් කර ඇත. |
| 4 | 1992 | ප්ලාස්ටික් පුටු | 18 | 8,595.00 | 2014 භාණ්ඩ සමීක්ෂණය අනුව වෙන්දේසි කර ඇත.ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 05 සටහන් කර ඇත. |
| 5 | 1992 | සෙන්ට්‍රික් වතුර මෝටරය | 1 | 15,506.00 | වෙන්දේසි කර ඇත .ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 02 හි සටහන් කර ඇත. |
| 6 | 1993 | සෙන්ට්‍රික් වතුර මෝටරය | 1 | 5,700.00 | වෙන්දේසි කර ඇත .ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 02 හි සටහන් කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | 1995 | වානේ අල්මාරි | 1 | 3,890.00 | වෙන්දේසි කර ඇත.ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 04 සටහන් කර ඇත. |
| 8 | 1995 | ප්ලාස්ටික් පුටු | 900 | 382,500.00 | 391 ක් වෙන්දේසි කර ඇත. 2014 භාණ්ඩ සමීක්ෂණය අනුව වෙන්දේසි කර ඇත.ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 05 සටහන් කර ඇත. |
| 9 | 1996 | ඇල්ෆා ලාච්චු 4 ෆයිල් කබඩ් | 1 | 6,100.00 | වෙන්දේසි කර ඇත.ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 04 සටහන් කර ඇත. |
| 10 | 1996 | ඇඳි සහිත පදම් කල පුටු | 2 | 1,700.00 | 01ක් වෙන්දේසි කර ඇත.2014 භාණ්ඩ සමීක්ෂණය අනුව ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 07 සටහන් කර ඇත. |
| 11 | 1997 | ප්ලාස්ටික් පුටු | 12 | 9,900.00 | වෙන්දේසි කර ඇත. ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 05 සටහන් කර ඇත. |
| 12 | 1998 | ඇල්ෆා කබඩ් | 1 | 5,250.00 | වෙන්දේසි කර ඇත.ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 04 සටහන් කර ඇත. |
| 13 | 1998 | කුබෝටා වතුර මෝටරය | 1 | 32,950.00 | වෙන්දේසි කර ඇත .ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 02 හි සටහන් කර ඇත. |
| 14 | 1998 | කාර්යාල කබඩ් | 1 | 5,175.00 | වෙන්දේසි කර ඇත.ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 04 සටහන් කර ඇත. |
| 15 | 1999 | ප්ලාස්ටික් ළමා පුටු | 20 | 3,500.00 | 14 ක් වෙන්දේසි කර ඇත.2014 භාණ්ඩ සමීක්ෂණය අනුව ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 14සටහන් කර ඇත. |
| 16 | 1999 | වානේ කබඩ් | 1 | 3,500.00 | වෙන්දේසි කර ඇත.ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 04 සටහන් කර ඇත. |
| 17 | 2000 | සෙන්ට්‍රික් වතුර මෝටරය | 1 | 5,184.00 | වෙන්දේසි කර ඇත .ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 02 හි සටහන් කර ඇත. |
| 18 | 2001 | වානේ කබඩ් | 6 | 33,560.00 | 04 ක් වෙන්දේසි කර ඇත.ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 04 සටහන් කර ඇත. |
| 19 | 2001 | ෆයිල් කබඩ් | 3 | 10,521.77 | 01ක් වෙන්දේසි කර ඇත. ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 48 සටහන් කර ඇත. |
| 20 | 2001 | වානේ පුටු | 12 | 9,574.00 | 2014.08.27 දින හොරවල උප කාර්යාලයේදී වෙන්දේසි කර ඇත. ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 4 සටහන් කර ඇත. |
| 21 | 2002 | ප්ලාස්ටික් පුටු | 12 | 4,380.00 | වෙන්දේසි කර ඇත ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 05 සටහන් කර ඇත. |
| 22 | 2002 | ප්ලාස්ටික් පුටු | 60 | 19,500.00 | වෙන්දේසි කර ඇත ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 05 සටහන් කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 23 | 2002 | ප්ලාස්ටික් දම්රෝ පුටු | 43 | 14,835.00 | වෙන්දේසි කර ඇත .ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 05 හා පිටු අංක 08 හි සටහන් කර ඇත |
| 24 | 2007 | වාගේ කුෂන් ඇඳි පුටු | 9 | 15,750.00 | වෙන්දේසි කර ඇත .ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 04 සටහන් කර ඇත |
| 25 | 2007 | වාගේ කෑම මේස පුටු | 12 | 6,960.00 | 10ක් වෙන්දේසි කර ඇත .ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 10 සටහන් කර ඇත |
| 26 | 2007 | ප්ලාස්ටික් පිනික්ස් පුටු | 12 | 6,600.00 | වෙන්දේසි කර ඇත. ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 08 හි දින සටහන් කර ඇත |
| 27 | 2007 | කුෂන් පුටු | 1 | 6,615.00 | 2014 භාණ්ඩ සමීක්ෂණය අනුව වෙන්දේසි කර ඇත. ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 14 හි දින සටහන් කර ඇත |
| 28 | 2008 | පුටු | 10 | 35,000.00 | 05 ක් වෙන්දේසි කර ඇත.2014 භාණ්ඩ සමීක්ෂණය අනුව ඉන්වෙන්ට්‍රි ලේඛන 01 අනුව පිටු අංක 18 සටහන් කර ඇත. |
| 29 | 2008 | ප්ලාස්ටික් ළමා පුටු | 63 | 20,475.00 | 37 ක් වෙන්දේසි කර ඇත.2014 භාණ්ඩ සමීක්ෂණය අනුව ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 11 සටහන් කර ඇත. |
| 30 | 2011 | ප්ලාස්ටික් පුටු | 24 | 20,160.00 | 2010/2014 භාණ්ඩ සමීක්ෂණය අනුව වෙන්දේසි කර ඇත. ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 08 හා පිටු අංක 20 සටහන් කර ඇත. |
| 31 | 2011 | ප්ලාස්ටික් පුටු | 24 | 8,040.00 | 2014 භාණ්ඩ සමීක්ෂණය අනුව වෙන්දේසි කර ඇත. ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 20 සටහන් කර ඇත. |
| 32 | 2012 | ප්ලාස්ටික් පුටු | 1000 | 700,000.00 | 2014 භාණ්ඩ සමීක්ෂණය අනුව 627 ක් වෙන්දේසි කර ඇත. ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 20 හාපිටු අංක 25 සටහන් කර ඇත |
| 33 | 2012 | ආරාධිත පුටු | 20 | 26,000.00 | 07ක් වෙන්දේසි කර ඇත .ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 20 සටහන් කර ඇත |
| | | එකතුව | | 1,484,570.77 | |

**02.පිරියත උපකරණ**

| අනු අංකය | වර්ෂය | පිරියත උපකරණ | ප්‍රමාණය | වටිනාකම (රු.) | වෙනත් |
|---|---|---|---|---|---|
| 1 | 1997 | වතුර මෝටරය | 1 | 7935.00 | වෙන්දේසි කර ඇත .ඉන්වෙන්ට්‍රි ලේඛන 02 අනුව පිටු අංක 02 හි සටහන් කර ඇත. |
| | | එකතුව | | 7935.00 | |

**3 ලී බඩු උපකරණ**

| අනු අංකය | වර්ෂය | පිරියත උපකරණ | ප්‍රමාණය | වටිනාකම (රු.) | වෙනත් |
|---|---|---|---|---|---|
| **1** | 1992 | බුරුත ලියන මේස පුටු | 6 | 3,450.00 | 2008.12.31 දිනට ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඉදිරියට ශේෂය සටහන් නොවේ.භෞතිකවද දක්නට නොමැති බැවින් 2008 වර්ෂයට පෙර ඉවත්වූවා සේ සලකා ලේඛනයෙන් ඉවත් කිරීමට කමිටුව තීරණය කිරීම |
| **2** | 2003 | ඇඳි බංකු | 4 | 15,900.00 | 2008.12.31 දිනට ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඉදිරියට ශේෂය 02 ක් ලෙස සටහන් කර ඇත .භෞතිකවද එම ඇඳි බංකු 02 නොමැති බැවින් 2008 වර්ෂයට පෙර ඉවත්වූවා සේ සලකා ලේඛනයෙන් ඉවත් කිරීමට කමිටුව තීරණය කිරීම |
| 3 | 2014 | ලී ළමා පුටු | 12 | 10,800.00 | 06 ක් වෙන්දේසි කර ඇත. 2014 භාණ්ඩ සමීක්ෂණය අනුව ඉන්වෙන්ට්‍රි ලේඛන 02 පිටු අංක 13 සටහන් කර ඇත. |
| | | එකතුව | | 30,150.00 | |

01. ඩබ්. ඒ.එම්.අයි.එස්.තෙන්නකෝන් මිය - කමිටු සභාපති
    ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරි
02. සමින්ද කුමාර මහතා කමිටු සාමාජික
    වැඩ අධිකාරි
03. පාලිත කුලරත්න මහතා කමිටු සාමාජික
    අභ්‍යන්තර විගණන නිලධාරි
04. වයි.ඩී ප්‍රේමලතා මිය කමිටු සාමාජික
    සංවර්ධන සහකාර
05. ජානක උදයංග මහතා කමිටු සාමාජික
    කළමනාකරණ සේවා නිලධාරි

**<u>තීරණය</u>**

මතුගම ප්‍රාදේශීය සභා ස්ථාවර වත්කම් ලේඛනයේ කාර්යාල උපකරණ,පිරියත,ලී බඩු උපකරණ,යන්ත්‍ර,පරිගණක අයිතම යටතේ ඇමුණුමේ සඳහන් පරිදි ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව ඉවත් කර ඇති නමුත් 1992 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් ඉදිරියට ගෙන එන ලද ශේෂය නිවැරදි කිරීම විගණනය විසින් ද පෙන්වා දී ඇති බැවින් 2022.12.31 දිනට අවසන් මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීම සඳහා ගරු සභාවේ අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

## <u>6.1.10 - යෝජනාව</u>

2023 මහජන පුස්තකාල උපදේශක කමිටු සාමාජික ලේඛනය ගරු සභාවේ අනුමැතියට ඉදිරිපත් කරමි.

## මහජන පුස්තකාල උපදේශක කමිටු සාමාජික ලේඛනය-2023

| | | |
|---|---|---|
| සභාපති | :- | මෙරිල් මුණසිංහ මහතා<br>සභාපති,මතුගම ප්‍රාදේශීය සභාව |
| පුස්තකාල උපදේශක කමිටුවේ කැඳවුම්කරු | :- | කේ.ඩබ්.සුනේත්‍රා කාරියවසම් මිය<br>ලේකම්, මතුගම ප්‍රාදේශීය සභාව |
| පුස්තකාල උපදේශක කමිටුවේ ලේකම් | :- | ඒ.පී.පී.පුෂ්පකුමාරි මහත්මිය<br>පුස්තකාලයාධිපති<br>සී.ඩබ්.ඩබ්.කන්නන්ගර<br>මහජන පුස්තකාලය,මතුගම |
| ගරු ප්‍රාදේශීය සභා සභික ධූරදාරීන් | :- | කේ.ඞී.මිත්‍රානන්ද මහතා- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී<br>කමිල් කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී<br>සීතා ඩයස් මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| **කමිටු සාමාජිකයින්** | | |
| පූජ්‍ය යටදොලවත්තේ චන්ද්‍රසිරි හිමි | - | විහාරාධිපති,මතුගම සුදර්ශනාරාමය,මතුගම. |
| පූජ්‍ය ඕවිටිගල සුමේධ හිමි | - | විහාරාධිපති,සුනන්දාරාම පිරිවෙන, ඕවිටිගල |
| උදයදාස් පියතුමා | - | ශාන්තමේරි දේවස්ථානය,මතුගම. |
| කේ.කේ.ඞී.ආර්.සංජීව මහතා | - | ප්‍රජා සංවර්ධන නිලධාරී, මතුගම ප්‍රාදේශීය සභාව |
| මතුගම සෙනෙවිරුවන් මහතා | - | ලේඛක,ගලබඩයාවත්ත පාර,මතුගම. |
| එස්.ආර්.ලියනගේ මහතා | - | විශ්‍රාමලත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ<br>අංක 15,පළමු පටුමග,ආඳාගල පාර,මතුගම |
| සෝමරත්න මල්ලිකාරච්චි මහතා | - | විශ්‍රාමලත් විදුහල්පති,කජුගහවත්ත,<br>නවුත්තුඩුව |
| ප්‍රේමා ජයසිංහ මහත්මිය | - | විශ්‍රාමලත් පාඨශාලාචාර්ය,එක්සත් මාවත,<br>ගල්මත්ත,වලගෙදර |
| දයාසිරි පතිරගේ මහතා | - | ඉද්දගොඩ,මතුගම |
| රන්දුනු ජයලත් මහතා | - | විදුහල්පති,ආනන්ද ශාස්ත්‍රාලය,මතුගම |
| බී.ඒ.ධර්මසේන මහතා | - | විශ්‍රාමලත් පාඨශාලාචාර්ය,"දර්ශන"<br>ඇල්හේන,යටදොලවත්ත,මතුගම |
| තුෂාරි තිලකරත්න මහත්මිය | - | විවාහ රෙජිස්ට්‍රාර්,ගබඩා හන්දිය,වැලිපැන්න |
| ටී.ආරියසේන ප්‍රනාන්දු මහතා | - | විශ්‍රාමලත්පාඨශාලාචාර්ය,"සමරුව",මීගම,දර්ගා නගර |

**තීරණය**

2023 මහජන පුස්තකාල උපදේශක කමිටු සාමාජික ලේඛනය ගරු සභාවේ අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

### 6.1.11- යෝජනාව

තඹරැටිය ප්‍රජා ශාලාව සහ දිප්පිට පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය පළාත් පාලන මැතිවරණයේ ඡන්ද මධ්‍යස්ථාන ලෙස භාවිත කිරීමට නියමිත බැවින් පානීය ජල පහසුකම්,විදුලිය,ආරක්ෂක වැට සහ අනෙකුත් පහසුකම් ඇති කිරීම සඳහා ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරමි.

**තීරණය**

තඹරැටිය ප්‍රජා ශාලාව සහ දිප්පිට පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය පළාත් පාලන මැතිවරණයේ ඡන්ද මධ්‍යස්ථාන ලෙස භාවිත කිරීමට නියමිත බැවින් පානීය ජල පහසුකම්,විදුලිය,ආරක්ෂක වැට සහ අනෙකුත් පහසුකම් ඇති කිරීම සඳහා ගරු සභාවේ අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

## 6.1.12 - යෝජනාව

ශ්‍රවණාගාරය සහ භූමිය සංවර්ධනය කොට පහසුකම් සැලසීම සඳහා ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරමි.

**තීරණය**

ශ්‍රවණාගාරය සහ භූමිය සංවර්ධනය කොට පහසුකම් සැලසීම සඳහා ගරු සභාවේ අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

## 6.1.13 - යෝජනාව

මතුගම කන්දහේන මද්දෙගෙදර වත්තේ සේවා පියසක් ඉදිකර දැනට ප්‍රදේශයේ ජනතාව පොදු වැඩ කටයුතු සඳහා යොදා ගන්නා අතර,එම සේවා පියස සහ භූමිය සංවර්ධන කටයුතු කර ගැනීමට ඉඩමේ අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වීම ගැටළු සහගතව ඇත.මෙම තත්වය වළක්වා ගැනීම සඳහා එම ඉඩමේ අක්කර 01ක පමණ වන සේවා පියස සහිත කොටස මතුගම ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සඳහා ගරු සභා අනුමැතියට යෝජනා කරමි.

**තීරණය**

මතුගම කන්දහේන මද්දෙගෙදර වත්තේ සේවා පියසක් ඉදිකර දැනට ප්‍රදේශයේ ජනතාව පොදු වැඩ කටයුතු සඳහා යොදා ගන්නා අතර,එම සේවා පියස සහ භූමිය සංවර්ධන කටයුතු කර ගැනීමට ඉඩමේ අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වීම ගැටළු සහගතව ඇත.මෙම තත්වය වළක්වා ගැනීම සඳහා එම ඉඩමේ අක්කර 01ක පමණ වන සේවා පියස සහිත කොටස මතුගම ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සඳහා ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

## 6.1.14 - යෝජනාව

නැබඩ පාර රථ වාහන නැවතුම්පොළ අසළ දෙපා ඇළ සැකසීම සඳහා ගරු සභා අනුමැතියට යෝජනා කරමි.

**තීරණය**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් නැබඩ පාර රථ වාහන නැවතුම්පොළ අසළ දෙපා ඇළ සැකසීම සඳහා ගරු සභා අනුමැතියට යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

## 6.1.15 - යෝජනාව

මතුගම ප්‍රාදේශීය සභාවේ වැලිපැන්න උප කාර්යාල බල ප්‍රදේශයේ 5 කණුව මංසන්ධිය කර්මාන්තපුරය සහ අවට ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි විය.ජනාවාස වී එදිනෙදා විශාල ජනතාවක් කේන්ද්‍රගත වන ස්ථානයක් වන බැවින් කුඩා නගරයක් ලෙස ප්‍රකාශයට පත් කොට පහසුකම් සපයා පල්ලෙගොඩ වතුයායේ බටහිර සහ දකුණු දෙසින් නගර සංවර්ධනය සඳහා ප්‍රමාණවත් භූමිය පවරා ගෙන ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

**තීරණය**

මතුගම ප්‍රාදේශීය සභාවේ වැලිපැන්න උප කාර්යාල බල ප්‍රදේශයේ 5 කණුව මංසන්ධිය කර්මාන්තපුරය සහ අවට ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි විය.ජනාවාස වී එදිනෙදා විශාල ජනතාවක් කේන්ද්‍රගත වන ස්ථානයක් වන බැවින් කුඩා නගරයක් ලෙස ප්‍රකාශයට පත් කොට පහසුකම් සපයා පල්ලෙගොඩ වතුයායේ බටහිර සහ දකුණු දෙසින් නගර සංවර්ධනය සඳහා ප්‍රමාණවත් භූමිය පවරා ගෙන ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා

කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය**
6.1.15 යෝජනාව සම්බන්ධයෙන් කතා කරන්න කැමතියි. ඇත්තටම ගල්මත්ත ප්‍රදේශය දැන් දියුණු වෙලා.ඒ වගේම ආඳවල ග්‍රාම සේවා වසම සහ බොන්දුපිටිය ග්‍රාම සේවා වසම ඒ මායිම්වල තියෙන ගම්.මේ වසම්වල ඉඳන් ගල්මත්තට එනවා කියන්නේ ඇත්තටම දුෂ්කරයි.ආඳවල ප්‍රදේශයේ ඉඳලා වරකතොල්ල ප්‍රදේශය වන තෙක් ජනතාවට බස් රථ දෙකක ගමන් කරන්න වෙනවා.පොදු ජනතාවගේ යහපත වෙනුවෙන් වැඩි ප්‍රතිලාභ ලැබෙන යෝජනාවක් හැටියට මේ යෝජනාව ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා සිටිනවා.

**6.1.16 - යෝජනාව**
යටදොළවත්ත නගරය සඳහා යෝජනා කොට ඇති සනීපාරක්ෂක වැසිකිලි පද්ධතිය ඉදි කොට මහජනයාට පහසුකම් සැලසීම සඳහා නගර ආසන්නයේ වැවිලි සමාගම විසින් භාවිත කරන භූමිය පර්චස් 40ක් පමණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

**තීරණය**
යටදොළවත්ත නගරය සඳහා යෝජනා කොට ඇති සනීපාරක්ෂක වැසිකිලි පද්ධතිය ඉදි කොට මහජනයාට පහසුකම් සැලසීම සඳහා නගර ආසන්නයේ වැවිලි සමාගම විසින් භාවිත කරන භූමිය පර්චස් 40ක් පමණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.17 - යෝජනාව**
යටදොළ මහ කොස්ගහමුල්ල මාර්ගය දකුණුපස පැති බැම්ම සහ නල්ලගොඩ මාර්ගයේ දකුණුපස පැති බැම්ම අධික වර්ෂාවෙන් විනාශ වී ඇති බැවින් මෙම පැති බැම් අළුතින් ඉදි කිරීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

**තීරණය**
යටදොළ මහ කොස්ගහමුල්ල මාර්ගය දකුණුපස පැති බැම්ම සහ නල්ලගොඩ මාර්ගයේ දකුණුපස පැති බැම්ම අධික වර්ෂාවෙන් විනාශ වී ඇති බැවින් මෙම පැති බැම් අළුතින් ඉදි කිරීමට සුදුසු බව ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.18 - යෝජනාව**
මතුගම ප්‍රාදේශීය සභාවට අයත් ආයුර්වේද බෙහෙත් ශාලා හතරෙහි අත්‍යාවශ්‍ය ඖෂධ තොග නිම වෙමින් පවතින හෙයින් 2023 වර්ෂයේ පළමු කොටස වෙනුවෙන්,නාවින්න ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් අත්‍යාවශ්‍ය ඖෂධ රු.750,000.00ක රැගෙන ඒම සඳහා ගරු සභා අනුමැතියට යෝජනා කරමි.

**තීරණය**
මතුගම ප්‍රාදේශීය සභාවට අයත් ආයුර්වේද බෙහෙත් ශාලා හතරෙහි අත්‍යාවශ්‍ය ඖෂධ තොග නිම වෙමින් පවතින හෙයින් 2023 වර්ෂයේ පළමු කොටස වෙනුවෙන්,නාවින්න ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් අත්‍යාවශ්‍ය ඖෂධ රු.750,000.00ක රැගෙන ඒම සඳහා ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

ආයුර්වේද ඖෂධ ශාලා හතර සඳහා ඖෂධ මිලදී ගැනීමේ යෝජනාව සම්බන්ධව කතා කරන්නේ.වර්තමානය වන විට බෙහෙත්වල මිල ගණන් වැඩි වී ඇති නිසා මේ මුදල රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කරන මෙන් ඉල්ලා සිටිනවා.

**6.1.19 - යෝජනාව**

දිප්පිට පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ගැටළුවක් ව පවතින මායිම් තාප්පය ඉදි කිරීම සහ ළිඳ ආවරණය කිරීම සඳහා රු.800 000.00 ඇස්තමේන්තුව ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරමි.(ඇමුණුම -01)

**තීරණය**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද දිප්පිට පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ගැටළුවක් ව පවතින මායිම් තාප්පය ඉදි කිරීම සහ ළිඳ ආවරණය කිරීම සඳහා රු.800 000.00ක ඇස්තමේන්තුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.20 - යෝජනාව**

පළාත් නිශ්චිත ප්‍රධාන යටතේ මපා.අංක N 238152349001 යටතේ, මතුගම ප්‍රාදේශීය සභාවට අයත් මතුගම උගල්වැටිකන්ද මාර්ගයේ සිට දේවගොඩකන්ද පාර දක්වා අතුරු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.4 000 000.00 ක ඇස්තමේන්තුව ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරමි.(ඇමුණුම-02)

**තීරණය**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද පළාත් නිශ්චිත ප්‍රධාන යටතේ මපා.අංක N 238152349001 යටතේ,මතුගම ප්‍රාදේශීය සභාවට අයත් මතුගම උගල්වැටිකන්ද මාර්ගයේ සිට දේවගොඩකන්ද පාර දක්වා අතුරු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.4 000 000.00 ක ඇස්තමේන්තුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.21 - යෝජනාව**

පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ මතුගම ප්‍රාදේශීය සභාවට අයත් කොස්වත්ත ගොඩ පාර හරහා විධිමත්ව ජලය බැස යාමට හැකි වන පරිදි බෝක්කුවක් යොදා සංවර්ධනය කිරීමට පළාත් සංවර්ධන ප්‍රධාන යටතේ රු.5000 000.00 ක් ප්‍රතිපාදන වෙන් වී ඇති බව පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක CMWP/PLN 6/ K11/2023 හා 2023-01-31 දිනැති ලිපියෙන් දන්වා ඇත. එම ව්‍යාපෘතිය අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරමි.

**තීරණය**

පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ මතුගම ප්‍රාදේශීය සභාවට අයත් කොස්වත්ත ගොඩ පාර හරහා විධිමත්ව ජලය බැස යාමට හැකි වන පරිදි බෝක්කුවක් යොදා සංවර්ධනය කිරීමට පළාත් සංවර්ධන ප්‍රධාන යටතේ රු.5000 000.00ක් ප්‍රතිපාදන වෙන් වී ඇති බව පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක CMWP/PLN 6/ K11/2023 හා 2023-01-31 දිනැති ලිපියෙන් දන්වා ඇත.එම ව්‍යාපෘතිය ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**6.1.22 - යෝජනාව**

බෙලිඅත්ත කන්ද පානීය ජල ව්‍යාපෘතියේ අවසන් අදියර සඳහා සහා අරමුදලින් හෝ වෙනත් ප්‍රදානයකින් ඉටු කර ගැනීමට රු.2361356.80 ක් වූ ඇස්තමේන්තුව ගරු සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.(ඇමුණුම - 03)

**තීරණය**

බෙලිඅත්ත කන්ද පානීය ජල ව්‍යාපෘතියේ අවසන් අදියර සඳහා සහා අරමුදලින් හෝ වෙනත් ප්‍රදානයකින් ඉටු කර ගැනීමට රු 2361356.80.ක් වූ ඇස්තමේන්තුව ගරු සභා අනුමැතිය සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය .

**6.1.23 - යෝජනාව**

සභාවේ ඩුප්ලෝ යන්ත්‍ර ක්‍රියාකරු තනතුර දැරූ කාර්යාල කාර්ය සහායක විශ්‍රාම ලබා ඇති බැවින් ඒ පිළිබඳ ව පුහුණුව ලත් යූ.කේ.ඩී.සුමිත් මහතාගෙන් එම සේවය ශ්‍රම කුලී පදනම මත දිනකට රු.1500.00ක වැටුපක් ලබා දී ඉටු කර ගැනීමට ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**තීරණය**

සභාවේ ඩුප්ලෝ යන්ත්‍ර ක්‍රියාකරු තනතුර දැරූ කාර්යාල කාර්ය සහායක විශ්‍රාම ලබා ඇති බැවින් ඒ පිළිබඳ ව පුහුණුව ලත් යූ.කේ.ඩී.සුමිත් මහතාගෙන් එම සේවය ශ්‍රම කුලී පදනම මත දිනකට රු1500.00.ක වැටුපක් ලබා දී ඉටු කර ගැනීමට ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**6.1.24 - යෝජනාව**

2022 වර්ෂය සඳහා මතුගම ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් සහ සේවකයින් සඳහා නිල ඇඳුම් රෙදි මිළ දී ගැනීම සඳහා වූ පහත සඳහන් වච්චර්පත් මහ සභාවේ ගෙවීම් අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

| | | |
|---|---|---|
| 01. | සඳුන් ටෙක්ස්ටයිල් | රු.225795.00 |
| 02. | ඩී.ඩී.චමින්ද (ඩොලර් ගාමන්ට්ස්) | රු.813000.00 |
| 03. | පියරත්න ටෙක්ස්ටයිල් | රු. 73500.00 |

**තීරණය**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් 2022 වර්ෂය සඳහා මතුගම ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් සහ සේවකයින් සඳහා නිල ඇඳුම් රෙදි මිළ දී ගැනීම සඳහා වූ පහත සඳහන් වච්චර්පත් මහ සභාවේ ගෙවීම් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් එය ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.

| | | |
|---|---|---|
| 01. | සඳුන් ටෙක්ස්ටයිල් | රු.225795.00 |
| 02. | ඩී.ඩී.චමින්ද (ඩොලර් ගාමන්ට්ස්) | රු.813000.00 |
| 03. | පියරත්න ටෙක්ස්ටයිල් | රු. 73500.00 |

## 6.1.25 - යෝජනාව

මතුගම ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් සඳහා ළමා ඩෙස් හා ළමා මේස මිළ දී ගැනීම සඳහා වූ තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව ගරු මහ සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

පෙර පාසල් මේස හා පුටු මිළ දී ගැනීම සඳහා විරාත් ෆර්නිචර්,හිරු ෆර්නිචර්,ආසිරි ෆර්නිචර් යන ආයතන ත්‍රිත්වයෙන් මිළ ගණන් ලැබී ඇති අතර පහත වගුව මගින් එම මිළ ගණන් දක්වා ඇත.

| ආයතනය | ළමා මේසවල මිළ(රු.) | ළමා පුටුවල මිළ (රු.) | වෙනත් කරුණු | |
|---|---|---|---|---|
| | | | ලී වර්ගය | |
| විරාත් ෆර්නිචර් | 5500 | 1900 | සපු | නිශ්පාදන කාලය දින 45ක් ඇතුළත 50%ක් අත්තිකාරම් මුදල ලබා දිය යුතු ය. |
| හිරු ෆර්නිචර් | 4800 | 1450 | සපු | නිශ්පාදන කාලය දින 14 ක් ඇතුළත 50%ක් අත්තිකාරම් මුදල ලබා දිය යුතු ය. |
| ආසිරි ෆර්නිචර් | 5500 | 1800 | සපු | නිශ්පාදන කාලය දින 60 ක් ඇතුළත 20%ක් අත්තිකාරම් මුදල ලබා දිය යුතු ය. |

ඒ අනුව ඉහත මිළ ගණන් සැසදීමේ දී ලී වර්ග පිළිබඳ සලකා බැලීමේ දී සෑම ආයතනයකින් ම සපු ලී පමණක් ලබා දී ඇති අතර,ලී වර්ග පිළිබඳ ගැටළුවක් නොපවතී.අපගේ පිරිවිතර අනුව අවම මිළ ඉදිරිපත් කර ඇත්තේ හිරු ෆර්නිචර් ආයතන වේ.තව ද දින 14ක කාල සීමාවක් තුළ ළමා මේස හා පුටු නිශ්පාදනය කර ගත හැකි බැවින් එම ආයතනයෙන් ළමා පුටුවක් රු.1450.00 මුදලකටද ළමා මේසයක් රු.4800.00 මුදලට මිළ දී ගැනීම නිර්දේශ කරන්නෙමු.

1. වැඩ අධිකාරි - කේ.ඒ.සමින්ද කුමාර මයා
2. ප්‍රජා සංවර්ධන නිලධාරී - කේ.කේ.ආර්.ඒ.සංජීව මයා
3. කළ.සේවා නිලධාරී - කේ.කේ.ආර්.රාජනිකා මිය

**තීරණය**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් මතුගම ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් සඳහා ළමා ඩෙස් හා ළමා මේස මිළ දී ගැනීම සඳහා වූ තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව ගරු මහ සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

## 6.1.26 - යෝජනාව

2023පෙබරවාරි න්‍යාය පත්‍රයේ කාරක සභා වාර්තාවේ 11 වන අංකය යටතේ සඳහන් වූ භාණ්ඩ අපහරණ කමිටුව සඳහා පහත සඳහන් නිලධාරීන් තෝරා පත් කර ගැනීම සඳහා ගරු සභා අනුමැතියට යෝජනා කරමි.

1.අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී
2. පාලිත කුලරත්න මහතා - අභ්‍යන්තර විගණන නිලධාරී
3.සමින්ද කුමාර මහතා - වැඩ අධිකාරී
4.ඩබ්ලිව්.ඩී.සුනිල් ශාන්ත මහතා - ආදායම් පරීක්ෂක
5.පී.වී.සීතා රංජනී මහත්මිය - කාර්යයභාර නිලධාරී(ගල්මත්ත)

**තීරණය**

2023පෙබරවාරි න්‍යාය පත්‍රයේ කාරක සභා වාර්තාවේ 11 වන අංකය යටතේ සඳහන් වූ භාණ්ඩ අපහරණ කමිටුව සඳහා පහත සඳහන් නිලධාරීන් තෝරා පත් කර ගැනීම සඳහා ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

## 6.1.27 - යෝජනාව

පහත දක්වා ඇති මාර්ගවල වලවල් සෑදී ගමනාගමන කටයුතුවල දී දැඩි අපහසුතාවයකට ලක් වන බැවින් එම මාර්ග කඩිනමින් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභා අනුමැතියට යෝජනා කරමි.

1.පල්ලෙමුල්ල කටුවාලගොඩ මාර්ගය
2.නල්ලගොඩ මාර්ගය
3.හොරවල මාවතගොඩ හරස් මාර්ගය

**තීරණය**

පහත දක්වා ඇති මාර්ගවල වලවල් සෑදී ගමනාගමන කටයුතුවල දී දැඩි අපහසුතාවයකට ලක් වන බැවින් එම මාර්ග කඩිනමින් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

## 6.1.28 - යෝජනාව

මතුගම ප්‍රාදේශීය සභාවේ සේවය කරන ස්ථිර හා විශ්‍රාම වැටුප් ලබන නිලධාරීන් හා සේවකයින් 25 දෙනෙකු ඉදිරියෙන් දක්වා ඇති වටිනාකමට අදාළව ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සේවක ඇප ගිණුම් ආරම්භ කිරීමටත්, නිලධාරීන්ගෙන් මාසිකව රු.200/- ක් හා සේවකයින්ගෙන් මාසිකව රු.100/- බැගින් වැටුපෙන් අඩුකර ගිණුම් පොත් සඳහා මුදල් බැර කිරීමටත්, ඒ අනුව සේවක ඇප ගිණුම් පවත්වාගෙන යාමටත් ගරු සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**2023 වර්ෂයේ සේවක ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයින්**

| අංකය | නම | තනතුර | ඇප මුදලේ වටිනාකම |
|---|---|---|---|
| 01 | කේ කාරියවසම් මිය.එස්.ඩබ්. | ලේකම් | රු10000.00. |
| 02 | ආර්සන්දනායක මිය.එම්. | ප්‍රධාන කළමනා සේවා නිලධාරී | රු10000.00. |
| 03 | එම්ද අල්විස් මිය .පී.ටී.ඩී. | කාර්ය භාර නිලධාරී | රු10000.00. |
| 04 | පීසීතා රංජනී මිය.වී. | කාර්ය භාර නිලධාරී | රු10000.00. |
| 05 | නිලූෂි තනුජා මිය | කළමනාකරණ සේවා නිලධාරී | රු10000.00. |
| 06 | එච්සන්න මයානීල් ප්‍ර.ඩී.ඩබ්. | කළමනාකරණ සේවා නිලධාරී | රු10000.00. |
| 07 | පී මංගලිකා.දමයන්ති මිය | කළමනාකරණ සේවා නිලධාරී | රු10000.00. |
| 08 | රාජිකා රංගනී මිය | කළමනාකරණ සේවා නිලධාරී | රු10000.00. |
| 09 | උරේෂා සඳමාලි මිය | සංවර්ධන නිලධාරී | රු10000.00. |
| 10 | කුලංගා ගයාමි මිය | සංවර්ධන නිලධාරී | රු10000.00. |
| 11 | ප්‍රසානි වත්සලා මිය | සංවර්ධන නිලධාරී | රු10000.00. |
| 12 | අමිලා ලක්මිනි මිය | සංවර්ධන නිලධාරී | රු10000.00. |

| | | | |
|---|---|---|---|
| 13 | ඩබ්සුනිල් ශාන්ත මයා.ඩී. | ආදායම් පරීක්ෂක | රු5000.00 . |
| 14 | ඩබ්සන්න මයාසුනිල් ප්‍ර.ඒ. | ආදායම් පරීක්ෂක | රු5000.00 . |
| 15 | ඒපුෂ්ප කුමාරි මිය.පී.පී. | පුස්තකාලයාධිපති | රු 5000.00 . |
| 16 | ඉරේෂා මහවිතාන මෙනවිය | පුස්තකාලයාධිපති | රු5000.00 . |
| 17 | කරංගා රාජපක්ෂ මිය | පුස්තකාලයාධිපති | රු5000.00 . |
| 18 | කේෂාන්ති මියවෙස්මි ක්‍රි.ඒ. | පුස්තකාලයාධිපති | රු5000.00 . |
| 19 | නිශාන් තුළුන මයා | පුසුතකාල සේවක | රු5000.00 . |
| 20 | නිලූකා හෙට්ටිආරච්චි මිය | පුස්තකාල සේවක | රු5000.00 . |
| 21 | රන්දික නදීශාන් මයා | වෙළඳසැල් පරිපාලක | රු5000.00 . |
| 22 | ශාලිත ඩිලාන් මයා | ශ්‍රවනාගාර භාරකරු | රු3000.00 . |
| 23 | ඒවසන්ත මයා.පී.කේ. | වැඩ ක්ෂේත්‍ර කම්කරු | රු5000.00 . |
| 24 | නියෝමි ගීතානිද සිල්වා මිය | වැඩ ක්ෂේත්‍ර කම්කරු | රු3000.00 . |
| 25 | චන්දිමා ප්‍රියදර්ශනී ඉලේපෙරුම මිය | වැඩ ක්ෂේත්‍ර කම්කරු | රු3000.00 . |

<u>**තීරණය**</u>

මතුගම ප්‍රාදේශීය සභාවේ සේවය කරන ස්ථිර හා විශ්‍රාම වැටුප් ලබන නිලධාරීන් හා සේවකයින් 25 දෙනෙකු ඉදිරියෙන් දක්වා ඇති වටිනාකමට අදාළව ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සේවක ඇප ගිණුම් ආරම්භ කිරීමටත්, නිලධාරීන්ගෙන් මාසිකව රු.200/- ක් හා සේවකයින්ගෙන් මාසිකව රු.100/- බැගින් වැටුපෙන් අඩුකර ගිණුම් පොත් සඳහා මුදල් බැර කිරීමටත්, ඒ අනුව සේවක ඇප ගිණුම් පවත්වාගෙන යාමටත් ගරු සභා අනුමැතිය සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

## <u>6.1.29 - යෝජනාව</u>

මතුගම නගරයේ රථගාල සකස් කිරීම ඇතුළු නගර සංවර්ධන සැලසුම් සඳහා මතුගම ශ්‍රී සුදර්ශනාරාම පන්සල අසල පවතින පහත දැක්වෙන පෞද්ගලික එකී ඉඩම් කැබලි ඒවායේ හිමිකරුවන් සමඟ ඇතිකරගනු ලබන එකඟතාවයන්ට යටත් ව මතුගම ප්‍රාදේශය සභාවට පවරා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි. **(ඇමුණුම 04)**

<u>**තීරණය**</u>

මතුගම නගරයේ රථගාල සකස් කිරීම ඇතුළු නගර සංවර්ධන සැලසුම් සඳහා මතුගම ශ්‍රී සුදර්ශනාරාම පන්සල අසල පවතින පහත දැක්වෙන පෞද්ගලික එකී ඉඩම් කැබලි ඒවායේ හිමිකරුවන් සමඟ ඇතිකරගනු ලබන එකඟතාවයන්ට යටත් ව මතුගම ප්‍රාදේශය සභාවට පවරා ගැනීම සුදුසු බවට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

## <u>6.1.30 - යෝජනාව</u>

මතුගම බල ප්‍රදේශයේ වරිපනම් ගාස්තු ගෙවීමට සභාව වෙත පැමිණෙන සේවාලාභීන් සඳහා සභාව විසින් නිශ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 05ක් සහ පැළ බඳුනක් නොමිලේ ලබා දීම සුදුසු යැයි ගරු සභාවට යෝජනා කරමි.

තීරණය

මතුගම බල ප්‍රදේශයේ වරිපනම් ගාස්තු ගෙවීමට සභාව වෙත පැමිණෙන සේවාලාභීන් සඳහා සභාව විසින් නිශ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 05ක් සහ පැළ බඳුනක් නොමිලේ ලබා දීම සුදුසු යැයි ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**6.1.31 - යෝජනාව**

බප/මතු වැලිපැන්න සිංහල කනිෂ්ට විද්‍යාලයට යාබද හිස් ඉඩම එම විද්‍යාලයේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා හිමිකරුවන්ගේ එකඟතාවය ලබා ගෙන පරිත්‍යාගයක් ලෙස හෝ පවරාගෙන සංවර්ධනය කිරීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

තීරණය

බප/මතු වැලිපැන්න සිංහල කනිෂ්ට විද්‍යාලයට යාබද හිස් ඉඩම එම විද්‍යාලයේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා හිමිකරුවන්ගේ එකඟතාවය ලබා ගෙන පරිත්‍යාගයක් ලෙස හෝ පවරාගෙන සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**6.1.32 - යෝජනාව**

මතුගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පදිංචි ජනතාවට විශේෂයෙන් නාගරික ජනතාවට තම නිවාස හා දේපල සොර සතුරන්ගෙන් ආරක්ෂා වීම සඳහා CCTV කැමරා පද්ධති සවි කිරීම කර ගනු ලැබේ.මෙම කාර්ය කිරීමේදී අධික වියදමක් දරා ගැනීමට සිදු වීම නිසා ඒ සඳහා සුදුසු ආයතන ප්‍රාදේශිය සභාව සමඟ සම්බන්ධීකරණය කොට ණය සහන පදනම යටතේ ඉටු කර ගැනීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරමි.

තීරණය

මතුගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පදිංචි ජනතාවට විශේෂයෙන් නාගරික ජනතාවට තම නිවාස හා දේපල සොර සතුරන්ගෙන් ආරක්ෂා වීම සඳහා CCTV කැමරා පද්ධති සවි කිරීම කර ගනු ලැබේ.මෙම කාර්ය කිරීමේදී අධික වියදමක් දරා ගැනීමට සිදු වීම නිසා ඒ සඳහා සුදුසු ආයතන ප්‍රාදේශිය සභාව සමඟ සම්බන්ධීකරණය කොට ණය සහන පදනම යටතේ ඉටු කර ගැනීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**6.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

6.2.1 කොටගල වැව්ලි සමාගමට අයත් බෝපිටිය වතුයායේ යටදොළ නගරයට ආසන්නයේ පිහිටි ඉඩමෙන් අක්කර දෙකක පමණ කොටසක් සභාවට පවරා ගෙන යටදොළ උප නගරයක් ලෙසට සංවර්ධනය කළ යුතු බවට යෝජනා කරන අතර ඒ සඳහා අදාළ ආයතන දැනුවත් කර එම ඉඩම පවරා ගැනීමට කටයුතු කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>තීරණය</u>**

නමුණුකුල වැව්ලි සමාගමට අයත් බෝපිටිය වතුයායේ යටදොළ නගරයට ආසන්නයේ පිහිටි ඉඩමෙන් අක්කර දෙකක පමණ කොටසක් සභාවට පවරා ගෙන යටදොළ උප නගරයක් ලෙසට සංවර්ධනය කළ යුතු බවට යෝජනා කරන අතර ඒ සඳහා අදාළ ආයතන දැනුවත් කර එම ඉඩම පවරා ගැනීමට කටයුතු කරන ලෙස මෙම ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් මහත්මිය විසින් ස්ථිර කරන ල දින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

යටදොල කියන්නේ විශාල වශයෙන් මිනිසුන් ගැවසෙන ස්ථානයක්. යටදොල නගරයේ සිට අලුත්ගම නගරය දක්වාම ගමන් කරන්න පුළුවන් අතුරු මාර්ග දෙකක් සහ ඒ ප්‍රදේශය ආසන්නයේ පිහිටා තිබෙන පාසල හේතුවෙන් මේ ප්‍රදේශයට ජනතාව විශාල වශයෙන් ඒකරාශී වෙනවා.ඒ වගේම විශාල සාප්පු සංකීර්ණ හේතුවෙන් ජනතාවට සේවා සපයා ගැනීමේ පහසුකම් සැලසෙනවා.මීන් පෙර අවස්ථාවකදී මේ ප්‍රදේශයට මතුගම උසාවි සංකීර්ණය රැගෙන ඒම සඳහා උත්සාහ කරනු ලැබුවා.නමුත් තවමත් යටදොල ප්‍රදේශයට වැසිකිලියක්වත් නැහැ. මේ හේතුවෙන් යටදොල ප්‍රදේශය උප නගරයක් වශයෙන් සංවර්ධනය කිරීම සුදුසු බවට මම යෝජනා කරන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

128 වගන්තියට අනුව මේක අනිවාර්යෙන් ඇත්තක් කරගන්න පුළුවන්.

**6.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසෙකර මහතා විසින් යථා පරිදි කල් ගෙන ඇති යෝජනා :-**

6.3.1 අප සභාව සතු අළුත්ගම්ගොඩ පොදු සුසාන භූමිය කිහිප වරක් ම අපි එක්සත් සුභසාධක සමිතිය මඟින් ශ්‍රමදාන මට්ටමින් සුද්ද පවිත්‍ර කර ඇති අතර නැවත පෙබරවාරි මාසයේ ශ්‍රමදානයක් සංවිධානය කර ඇත.එම කටයුත්ත සාර්ථක කර ගැනීමට සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රය සහ තණකොළ කපන යන්ත්‍ර දෙකක් සහ කම්කරුවන් කිහිප දෙනෙකු ලබා දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

6.3.2 එම සුසාන භූමිය අසල ඇති විදුලි කණුවට ලොකු විදුලි ලාම්පුවක් සවි කරන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

6.3.1 **<u>තීරණය</u>**

අප සභාව සතු අළුත්ගම්ගොඩ පොදු සුසාන භූමිය කිහිප වරක් ම අපි එක්සත් සුභසාධක සමිතිය මඟින් ශ්‍රමදාන මට්ටමින් සුද්ද පවිත්‍ර කර ඇති අතර නැවත පෙබරවාරි මාසයේ ශ්‍රමදානයක් සංවිධානය කර ඇත.එම කටයුත්ත සාර්ථක කර ගැනීමට සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රය සහ තණකොළ කපන යන්ත්‍ර දෙකක් සහ කම්කරුවන් කිහිප දෙනෙකු ලබා දෙන මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

6.3.2 අප සභාව සතු අළුත්ගම්ගොඩ පොදු සුසාන භූමිය අසල ඇති විදුලි කණුවට ලොකු විදුලි ලාම්පුවක් සවි කරන මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**6.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා :-**

6.4.1 ආදාවල ගොඩදෙණියාවත්ත පාර වසර කීපයක් තිස්සේ කඩතොළු වී අබලන් වීමෙන් මහජනතාව මහත් පීඩාවකට පත් ව ඇති බැවින් එම ස්ථානයන් හඳුනාගෙන කඩිනමින් පිළිසකර කර ගැනීමට ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

6.4.2 ආදාවල කුරුඳුවත්ත පාර කොන්ක්‍රීට් අතුරා කඩිනමින් සංවර්ධනය කිරීමට ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

<u>තීරණය</u>

6.4.1 ආදාවල ගොඩදෙණියාවත්ත පාර වසර කීපයක් තිස්සේ කඩතොළු වී අබලන් වීමෙන් මහජනතාව මහත් පීඩාවකට පත් ව ඇති බැවින් එම ස්ථානයන් හඳුනාගෙන කඩිනමින් පිළිසකර කර ගැනීමට ගරු සභාවේ අනුමැතියට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් එය සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

6.4.2 ආදාවල කුරුඳුවත්ත පාර කොන්ක්‍රීට් අතුරා කඩිනමින් සංවර්ධනය කිරීමට ගරු සභාවේ අනුමැතිය සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් එය සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**6.5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් කුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා :-**

6.5.1 පාන්තිය වෙද නිවස මාවතේ නාම පුවරුවක් සවි කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කර ගැනීමට ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

<u>තීරණය</u>

6.5.1 පාන්තිය වෙද නිවස මාවතේ නාම පුවරුවක් සවි කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කර ගැනීමට ගරු සභාවේ අනුමැතිය සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් කුමාර මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න නාකන්දල මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
ගෙවීම් විස්තරයේ 212 අංකය යටතේ "2023 තක්සේරු දැන්වීම් බෙදීම ගාස්තු" කියලා දාලා තියෙනවා.අපි මේ පිළිබඳව දැනුවත් නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේක චක්‍රලේඛ මගින් ම ඒ නිලධාරීන්ට ලැබිලා තියෙන වරප්‍රසාදයක්.

අදාළ චක්‍රලේඛනය ලබාදී කරුණු පැහැදිලි කරන ලදී.

(මන්ත්‍රීවරුන්ගේ සෝෂාව නිසා අදහස් පැහැදිලිව නො ඇසෙයි.)

7. කාරක සභා වාර්තාව සලකා බැලීම.

2022 ජනවාරි මස 30 වන දින පවත්වන ලද මුදල් සහ ටෙන්ඩර් කමිටු වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලද බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**<u>2023 ජනවාරි මස 30 වන දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම.</u>**

<u>සාකච්ඡා කළ කරුණු</u>

1. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 78 වගන්තිය පරිදි ප්‍රාදේශීය සභාව පොදු මහජන සෞඛ්‍ය අධිකාරිය බැවින් මතුගම බල ප්‍රදේශයේ සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ කාර්යයෙන් එක් අංගයක් වන ආහාර පරීක්ෂා කිරීමට අවශ්‍ය ආහාර සාම්පල් මිළ දී ගැනීම සඳහා මතුගම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත අත්තිකාරම් මුදලක් ලබා දිය යුතු වේ.ඒ සඳහා මින් පෙර ලබා දී ඇති රු.1000.00ක මුදල රු.3000.00 දක්වා වැඩි කිරීමට මුදල් කාරක සභාවේ නිර්දේශ කරන ලදී.

2. 2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය ව ටෙන්ඩර් කරන ලද දේපළ සඳහා පහත සඳහන් පරිදි මිළ ගණන් කැඳවූ අතර ඒ සඳහා ඉදිරිපත් වූ ටෙන්ඩර්කරුවන්ගේ තොරතුරු පහත පරිදි වෙයි.

| | **2023 වර්ෂය සඳහා සභාව සතු දේපළ ප්‍රාදේශීය ව ටෙන්ඩර් කිරීම.** | | | |
|---|---|---|---|---|
| **අනු අංකය** | **දේපළ විස්තරය** | **අවම ලංසුව** | **ඉල්ලා ඇති මුදල** | **ඉල්ලුම්කරුගේ නම** |
| 1 | මතුගම නගරයේ පිහිටි හෝරා ස්ථම්භය | රු.125700.00 | රු.135000.00 | එයිට්කන් ස්පෙන්ස් ගාමන්ට් |
| 2 | මතුගම පොදු වෙළඳපොළ පොදු වැසිකිලිය | රු.311850.00 | රු.220000.00 | උහන්ඕවිට මාරගේ ඉසුරු ඕමාල් |
| | | | රු.250000.00 | දසුන් උපේන්ද්‍ර කළුතරගේ |
| | | | රු.311850.00 | උහන්ඕවිට මාරගේ ජීවන්ත මොහාන් |
| 3 | ගල්මත්ත වෙළඳ සංකීර්ණය කාය වර්ධන මධ්‍යස්ථානය | රු.156000.00 | රු.156000.00 | වජිර මධුසංක ජයසිංහ |

ඒ අනුව පොදු වෙළඳපොළ පොදු වැසිකිලිය වැඩිම මුදලකට ඉල්ලුම් කර ඇති උහන්ඕවිට මාරගේ ජීවන්ත මොහාන් මහතාගේ රු.311850.00ක ටෙන්ඩරය පිළිගැනීමටත්,මතුගම නගරයේ හෝරා ස්ථම්භය සඳහා ඉදිරිපත් වූ එකම ඉල්ලුම්කරු වන මතුගම එයිට්කන් ස්පෙන්ස් ගාමන්ට් ආයතනයට

ටෙන්ඩරය පිරිනැමීමටත්,ගල්මත්ත කායවර්ධන මධ්‍යස්ථානය සඳහා ඉදිරිපත් වූ වජිර මධුසංක ජයසිංහ මහතාගේ ටෙන්ඩරය පිළිගැනීමටත් මුදල් කමිටුව මගින් තීරණය විය.

3. පෙර පාසල් සඳහා ළමා ඩෙස් සහ පුටු තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශයට යටත් ව මිළදී ගැනීමට නිර්දේශ විය.

4. ඇතුලත්මුදලිගම කොම්පෝස්ට් අංගනයේ එකතු වන නොදිරන ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා ඉදිරිපත් ව ඇති මිළ ගණන් අතරින් වැඩි ම මිළ ඉදිරිපත් කර තිබෙන එම්.ඒ.නිමල් මහතා තෝරා ගැනීමටත්,එම ද්‍රව්‍ය අලෙවි කිරීමේ දී සභාවේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමටත් නිර්දේශ විය.

| කසළ අලෙවි කිරීම සඳහා ලැබුණු මිළ ගණන් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අනුඅංකය | ආයතනය | බේල් කරන ලද පෙට් බෝතල් | සනකම ප්ලාස්ටික් | බියර් ටින් | බොක්ස් බෝඩ් | බෝතල් කටු | ටින් | පොල් කටු |
| 1 | ඩබ්.එල්.රිෂාන් ගුණතිලක,නො.210/264,අළුත්ගම පාර,මතුගම. | රු.18.00 | රු.22.00 | රු.40.00 | රු.8.00 | රු.2.00 | රු.2.00 | රු.8.00 |
| 2 | එම්.ඒ.නිමල්,ශාන්ත ජෝර්ජ් වත්ත,ආදාගල පාර,ඇතුගත්මුදලිගම, මතුගම | රු.25.00 | රු.35.00 | රු.50.00 | රු.20.00 | රු.5.00 | රු.5.00 | රු.15.00 |
| 3 | අයි.එච්.සුගතදාස,පාන්තිය,මතුගම | රු.15.00 | රු.20.00 | රු.35.00 | රු.10.00 | රු.2.00 | රු.3.00 | රු.10.00 |

5. මතුගම බණ්ඩාරනායක මාවත කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානය සඳහා ගිවිසුම්ගත කාලය 2023.01.31 දිනෙන් අවසන් වෙයි.නව තක්සේරුවක් ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් සිදුකර ඇති අතර එය ලැබෙන තෙක් 2018 වසරේ තක්සේරු මුදල වන මාසික ව රු.20,000.00ක මුදලට, නව තක්සේරුව අනුව සංශෝධනය වීම් කොන්දේසිය ඇතුළත් කර 2023.02.01 දින සිට 2024.01.31 දින දක්වා ගිවිසුම්ගත වීමටත් මාසික ගාස්තුව එකවර වාර්ෂික ව අයකර ගැනීමටත් මුදල් කාරක සභාව නිර්දේශ කරන ලදී.

6. ආදාහනාගාරයේ වහලය අළුත්වැඩියා කිරීම සඳහා වූ රු.480,000.00 ඇස්තමේන්තුව නිර්දේශ කරන ලදී.

7. ප්‍රදේශවාසීන්ගේ පැමිණිලි සලකා බලා පහත දක්වා ඇති මාර්ගවල වලවල් සෑදී ගමනාගමන කටයුතුවල දි දැඩි අපහසුතාවන්ට ලක් වන බැවින් පහත සඳහන් මාර්ග කඩිනමින් අළුත්වැඩියා කිරීමට මුදල් කමිටුවේ නිර්දේශ කරන ලදී.

    1. පල්ලෙගොඩවත්ත මාර්ගය

2. ඉදිගස්තුඩුව මාර්ගය
3. කොස්ගහවිට මාර්ගය
4. වැලිපැන්න හිජ්රා මාවත
5. නුගගහලන්ද ප්‍රධාන මාර්ගය
6. වලගෙදර ලබුවැල්ගොඩ මාර්ගය
7. බදුගම පළමු මාවත
8. වැලිමානාන කුරුඳුවත්ත මාර්ගය
9. හොරවල මල්වතුකන්ද මාර්ගය
10. ඕවිටිගල සුනන්ද මාවත
11. පල්ලිගොඩ වික්‍රම මාවත
12. උගුල්වැටිකන්ද දේවාලකන්ද පාර
13. බාලිකා පාර
14. දඹුගොඩයාවත්ත පාර
15. ඇල්බට් විජේගුණවර්ධන මාවත - ඇස්තමේන්තු මුදල රු.500,000.00
16. සෝමපාල මාවත
17. පැස්කුවල් මාවත - ඇස්තමේන්තු මුදල රු.500,000.00
18. බිලිංගහකන්ද මාර්ගය - ඇස්තමේන්තු මුදල රු.370,000.00
19. තල්ගස්ගොඩ මාර්ගය
20. නවුත්තුඩුව ගොඩේගෙදර මාර්ගය
21. හේන්පිට මාර්ගය
22. පෙත්තකන්ද මාර්ගය - ඇස්තමේන්තු මුදල රු.440,000.00
23. හොරණගොඩ මාර්ගය
24. බෝගහවත්ත අතුරු මාර්ගය අළුත්වැඩියා කිරීම.
25. ඇලගහවත්ත පාර
26. දූවවත්ත කානගොඩ මාර්ගය

8. මතුගම පෙර පාසලේ ඇතුළත බිත්ති තීන්ත ආලේපය කර පිළිසකර කිරීම සඳහා රු.109,815.00ක ඇස්තමේන්තුව නිර්දේශ කරන ලදී.

9. මීගම පිහිටි "මීගමවත්ත"නැමැති ඉඩම මැන පිළියෙළ කර ඇති අංක 679 දරන පිඹුරේ කැබලි අංක 8 සහ 9 යන කැබලිවල මායිම් පෙන්වීම සඳහා මිළ ගණන් විවෘත කිරීම යටතේ,

| අනු අංකය | විස්තරය | ඉදිරිපත් වී ඇති ඉල්ලුම්කරුගේ නම | මිළ ගණන් |
|---|---|---|---|
| 1 | ඉහත අංක 8 සහ 9 දරන කැබලි මැන මායිම් පෙන්වා දීම සඳහා. | බලයලත් මිනින්දෝරු එස්.කේ.ජී.ඇලපාත | රු.30,000.00 |
| 2 | ඉහත අංක 8 සහ 9 දරන කැබලි මැන මායිම් පෙන්වා දීම සඳහා. | බලයලත් මිනින්දෝරු ඩබ්ලිව් ඩබ්ලිව් එල්.එල්.ගාමිණී | රු.32,000.00 |

ඒ අනුව අඩු ම මිළ ඉදිරිපත් කර තිබෙන බලයලත් මිනින්දෝරු එස්.කේ.ජී.ඇලපාත මහතා (රු.30,000.00) තෝරා ගැනීමට නිර්දේශ විය.

10. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගේ අංක KL/RP/3322 හා 2023/01/24 දිනැති ලිපියෙන් මෙම සභාව සතු නැබඩ පාර සාප්පු සංකීර්ණයේ ඉදිකර ඇති කඩ කාමර 19ක් සඳහා මාසික කුලිය වශයෙන් රු.5750.00ක මුදලක් අය කිරීමටත් ඉදිරි වසර දෙකක් සඳහා වලංගුව තක්සේරු කර එවා ඇත.එම රු.5750.00ක මාසික කඩ කුලී ලබා ගෙන ඇති අත්තිකාරම් මුදලින් කඩ කුලිය හිලව් කර ගැනීම යන කරුණු සැලකිල්ලට ගෙන ඇති බව සහ එම දේපළ යථා තත්වයෙන් පවත්වා ගෙන යැමට අවශ්‍ය අළුත්වැඩියා කටයුතු හා වරිපනම් බදු ගෙවීම් කටයුතු කඩ හිමියා විසින් දැරිය යුතු බවටත් දන්වා ඇති අතර ඒ අනුව ගිවිසුම්ගත වීමට පෙර මහ සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමටත් නිර්දේශ විය.

11. භාණ්ඩ සමීක්ෂණය මඟින් හඳුනාගත් ප්‍රාදේශීය සභාවට අයත් උප කාර්යාලවල සහ ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ අපහරණය සඳහා අපහරණ කමිටුවක් පත්කර ගැනීමට නිර්දේශ විය.

| | | |
|---|---|---|
| මෙරිල් මුණසිංහ මහතා | - | |
| නිශාන්ත කුලතුංග මහතා | - | |
| හින්ටන් මද්දගේ මහතා | - | පැමිණ නැත. |
| පුබුදු මධුරංග මහතා | - | පැමිණ නැත. |
| ධම්මික විජේසිංහ මහතා | - | පැමිණ නැත. |
| එන්.ප්‍රේමරත්න මහතා | - | |
| ප්‍රියංකා දමයන්ති මිය | - | |

**8. ආදායම් සහ වියදම් වාර්තා සලකා බැලීම.**

(2022 දෙසැම්බර් මාසයේ ආදායම් සහ වියදම් වාර්තා සභාවේ දැන ගැනීම සඳහා සභාගත කරන ලදී.(ඇමුණුම)

**9. පුද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

අද දින අතිරේක න්‍යාය පත්‍රයට යොමුකර තිබෙන යෝජනා ප්‍රමාණය අධික බැවින් එම යෝජනා සඳහා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු වශයෙන් අපි අදහස් දක්වන්නේ නැහැ. ඒ වගේම අපි කියන්නෙ නැහැ  අතිරේක යෝජනා දාන්න එපා කියලා.හදිසි අවශ්‍යතාවයකදී අතිරේක න්‍යාය පත්‍රයකට යෝජනා එකක් දෙකක් යෙදීම පිළිබඳව අපි විරුද්ධ වෙන්නේ නැහැ. නමුත් එකවර මෙවැනි විශාල යෝජනා සංඛ්‍යාවක් යෙදුවාම අපට ඒ පිළිබඳව අධ්‍යනය කර කරුණු දක්වන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන මහතා කොම්පෝස්ට් අංගනයේ වංචා දූෂණ සෙවීමේ කමිටුව නො කැඳවීම සම්බන්ධව ලේකම්තුමියට මූලික විමර්ශනයක් ඉල්ලා මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ගේ අත්සනින් යෝජනාවක් ඉදිරිපත් කර තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

මම ලිපිය පිළිබඳව සඳහන් කරන්නේ.අපි මතුගම ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනයේ වංචා දූෂණ සොයා බැලීම සඳහා මන්ත්‍රීවරු පස් දෙනෙක්ගෙන් සමන්විත කමිටුවක් පත් වුණා.ඒ කමිටුව නියෝජනය කරනවා කසුන් හිරෝෂණ මන්ත්‍රීතුමා,සුජීව නිර්මාන මන්ත්‍රීතුමා, සභාපති වශයෙන් සංජේ එරංග කරවිට මන්ත්‍රීතුමා,නිමාලක සුරංග මන්ත්‍රීතුමා සහ මම.කමිටුවේ ලේකම් වශයෙන් මම කොම්පෝස්ට් අංගනයේ වංචා දූෂණ සම්බන්ධයෙන් කමිටු වාර්තාවක් ඉදිරිපත් කළා.ඒ වාර්තාව අපි ඉදිරිපත් කළාට පස්සේ ඒ සම්බන්ධයෙන් කොමසාරිස්තුමිය ඇවිල්ලා අපෙන් කරුණු විමසලා පරීක්ෂණයක් ආරම්භ කළා.එහි ප්‍රතිඵලයක් වශයෙන් සහ සභාවේ තිබුණු දූර්වල පාලනය සම්බන්ධයෙන් අපේ හිටපු ලේකම්තුමියට ඉවත් වීමට සිදු වුණා.ඊට පසු අලුත් ලේකම්තුමිය පත්වෙලා මේ සභාවට ආවම අපි එතුමියව දැනුවත් කළා මේ කොම්පෝස්ට් අංගනය පිළිබඳව සොයා නොබලා කටයුතු කිරීමෙන් ලේකම්තුමියටත් හිටපු ලේකම්තුමියට වුණ දේම වෙන්න පුළුවන් කියලා. ඒ වෙලාවේ කරුණු විමසන්නේ නැතුව ලේකම්තුමිය කටයුතු කරන්න උත්සාහ ගත්තා.

ඒ වෙලාවේ මම ලේකම්තුමියට දුරකථනයෙන් කතා කළා.ඔබතුමිය අපේ කොම්පෝස්ට් අංගනය සම්බන්ධයෙන් අපි ඉදිරිපත් කළ වාර්තාව කියෙව්වාද ඇහුවා.නෑ මම කියෙව්වේ නෑ කිව්වා. කමිටුව විසින් ගත්ත තීරණයක් අපි සභාගත කරලා තියෙනවා,ඒක කියවලා බැලුවෙත් නැද්ද ඇහුවා.එහෙනම් කොම්පෝස්ට් අංගනය සම්බන්ධයෙන් කොහොමද දන්නෙ කියලා මම ඇහුවා.මේ කොම්පෝස්ට් අංගනය සම්බන්ධයෙන් අපි වැඩපිළිවෙළක් ඉදිරිපත් කරලා තියෙනවා.ඒ නිසා මේකට ඔබතුමිය ගන්න පියවර මොකක්ද කියලා මම ආපසු ඇහුවා.එහෙම පියවරක් ගන්න ඕන නෑ වගේ එකක් තමයි එතුමිය ප්‍රකාශ කළේ. දූරකතනයෙන් කියලා වැඩක් නැති නිසා මම නැවත 26 වැනි දා ලේකම්තුමිය අතට කොම්පෝස්ට් අංගනය හා සම්බන්ධව කමිටුව කැඳවන්න කියන ඉල්ලීම කළා.ඒ කළේ කොම්පෝස්ට් අංගනය හා සම්බන්ධ වර්තමාන තත්ත්වය මොකක්ද කියලා දැනගන්න අවශ්‍ය නිසා යි.

සති එකහමාරක් පමණ යනකොට මම නැවත ලේකම්තුමියට දුරකථන ඇමතුමක් ගත්තා.මම ඇහුවා කොම්පෝස්ට් අංගනය සම්බන්ධයෙන් ඉදිරි පියවරක් ගත්තද කියලා.එහෙම පියවරක් ගත්තේ නැහැ කිව්වා. වාර්තාව කියෙව්වාද ඇහුවාම ඒකත් නැහැ කියලා නැවත කිව්වා.මේ සම්බන්ධයෙන් ලේකම්තුමිය හිතා මතාම මග හැරිය බවක් පේන්නේ.මේ පිළිබඳව වහාම ක්‍රියාත්මක වන පරිදි පරීක්ෂණයක් පැවැත්වීමට සහකාර කොමසාරිස්තුමියට යවන්න.පළාත් අණ්ඩුකාරතුමාටත් යවන්න.මොකද ආයෙමත් මේ කටයුතු කලින් තිබුණු විදිහට නම් වෙන්නේ ඒක කරන්න දෙන්න බැහැ.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලිව නො ඇසේ.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

කොම්පෝස්ට් අංගනය සම්බන්ධ ව කමිටුවක් පත් කළේ වංචා දූෂණ එකේ සිදු වුණ නිසා.මේ පිළිබඳ දැනටත් අපට යම් යම් තොරතුරු ලැබෙනවා.මේ කමිටුවෙන් පත් කළ සේවකයින් නෙමෙයි,දැන් ඉන්න සේවකයින් පිළිබඳවත් අපට තොරතුරු ලැබෙනවා.දැන් නැවතත් කමිටුව විසින් පත් නොකළ වෙන වෙන අය මේ කොම්පෝස්ට් අංගනය සම්බන්ධව ක්‍රියා කරනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

හිටපු ලේකම්තුමිය ගියේ කොම්පෝස්ට් අංගනයේ තිබුණු වංචා දූෂණ සම්බන්ධව නෙමෙයි. ඒ තනතුරට අදාළ සුදුසුකම් සපුරපු නිලධාරියෙක් ආව නිසයි එතුමිය ගියේ. මොකද කොම්පෝස්ට් අංගනය සම්බන්ධව පත්වනු කමිටුව වෙන එකක්.ඒක අපි අගය කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

හිටපු ලේකම්තුමිය ඍජුවම මේකට සම්බන්ධ යි.ඒ සම්බන්ධතාවය කමිටු වාර්තාවේ තියෙනවා. මම නැවත නැවතත් මේ පිළිබඳව කතා කරන්න කැමති නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

කොම්පෝස්ට් අංගනයේ සිදුවුණු වංචා දූෂණ සම්බන්ධයෙන් විමර්ශන නිලධාරීන් ආවා.ඒ විමර්ශන නිලධාරියාට අපි කරුණු ඉදිරිපත් කළා.මේ කරුණු ඉදිරිපත් කිරීම සහ ලේකම්තුමියගේ තිබුණු පරිපාලන දුර්වලතා හේතුවෙන් තමයි එතුමියට ඉවත් වෙන්න සිදු වුණේ.මේ හැම සිදුවීමක්ම ඒකට බලපෑවා.මොකද කොම්පෝස්ට් අංගනයේ කොම්පෝස්ට් කොට්ට එක්දහස් පන්සියයකට සිදුවුන දෙයක් නැහැ.මේ සිදුවෙන හැම දේම සම්බන්ධව අපටත් තොරතුරු ලැබෙනවා. මොකද මේ මතුගමට ආදරය කරන පිරිසකුත් මේ ස්ථානවල සේවය කරනවා.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලිව නොඇසේ.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග මහතා**

අපේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ ස්වාමීන් වහන්සේ විදෙස් ගත වෙලා ඉන්න නිසා උන්වහන්සේ මගෙන් ඉල්ලීමක් කළා. උන්වහන්සේ 2018 සිට මේ වන තෙක් මතුගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී ධූරයක් නියෝජනය කරනවා.සභාපතිතුමා උන්වහන්සේට දැක්වූ සහයෝගයට විශේෂ ස්තුතිය පුද කරන්න කිව්වා.ඒ වගේම හිටපු ලේකම්තුමිය සහ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ම උන්වහන්සේගේ ස්තූතිය පුද කරන්න කිව්වා.බොහොම ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

වලගෙදර ග්‍රාම සේවා වසමේ ලබුවැල්ගොඩ මාර්ගය යම්කිසි පිළිසකර කිරීමක් සිදු කරනවා.ඒ පිළිබඳව ස්තූතිය ප්‍රකාශ කරනවා. ඒ වගේම ලබුවැල්ගොඩ කටකඳයාවත්ත මාර්ගය පිළිසකර කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.ඒ වගේම එළඹෙන මැතිවරණයට නාම යෝජනා බාර අරගෙන තියෙනවා.මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු බොහෝ පිරිසක් මැතිවරණය සඳහා පෙනී සිටිනවා.ඒ සියලුම දෙනාටම මම මේ අවස්ථාවේ සුභාශිංසන පළ කරනවා.ඒ වගේම මේ අවුරුදු හතර තිස්සේ සිදුවුණු අඩුපාඩු නිවැරදි කරගෙන කටයුතු කරන්න.2018 මන්ත්‍රීවරයෙක් වශයෙන් පත් වෙලා අපි මේ ගරු සභාවට ඇවිත් අපට කළ හැකි සාධාරණයක් කළා. හැමෝටම සුභ පතනවා.

න්‍යාය පත්‍රානුකූල ව මෙදිනට නියමිත කටයුතු අවසන් වීමෙන් පසු මහ සභාවේ කටයුතු ප.ව.01.50ට පමණ අවසන් විය.